# ළමා අපයෝජනය

## හඳුනා ගැනීම,වළක්වා ගැනීම හා කළමනාකරණය




මහාචාර්ය මුදිත විදානපතිරණ

විශේෂඥ වෛද්‍ය ශ්‍රියන්ත අමරරත්න

විශේෂඥ වෛද්‍ය ස්වර්ණා විජේතුංග

විශේෂඥ වෛද්‍ය බුද්ධි ජයසේකර

සංස්කාරක - විශේෂඥ වෛද්‍ය රොහාන් රුවන්පුර



ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

| | |
|---|---|
| මහාචාර්ය මුදිත විදානපතිරණ: | සභාපති, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අධ්‍යනාංශ මහාචාර්ය, විශේෂඥ අධිකරණ වෛද්‍ය, අධිකරණ වෛද්‍ය දෙපාර්තමේන්තුව, වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, |
| වෛද්‍ය ශ්‍රියන්ත අමරරත්න: | විශේෂඥ අධිකරණ වෛද්‍ය නිළධාරි, අධිකරණ වෛද්‍ය ඒකකය, දිස්ත්‍රික් මහ රෝහල, කළුතර |
| වෛද්‍ය ස්වර්ණා විජේතුංග: | ළමා මානසික රෝග විශේෂඥ, රිජ්වේ ආර්යා ළමා රෝහල, බොරැල්ල |
| වෛද්‍ය බුද්ධි ජයසේකර: | මානසික රෝග විශේෂඥ  වෛද්‍ය,මූලික රෝහල, දඹුල්ල |
| වෛද්‍ය රොහාන් රුවන්පුර: | විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරි,ශික්ෂණරෝහල, කරාපිටිය |

## කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ ගරු රාජ්‍ය ඇමතිතුමාගේ පණිවිඩය



සමස්ත ශ්‍රී ලාංකේය දරුවන්ගේ ආරක්ෂාව හා යහපැවැත්ම තහවුරු කරමින් ඔවුනට වඩා සුරක්ෂිත සමාජ වටපිටාවක් ගොඩනැංවීමේ කාර්යය අප අද දවසේ මුහුණ දෙන දැවැන්තම සමාජ අභියෝගයකි. අපි රජයක් වශයෙන් මෙම අසීරු අභියෝගය ජයග්‍රහණය කිරීමේ කාර්යය සඳහා ඇප කැප වී කටයුතු කරන්නෙමු. ලාංකීය ජන සමාජය පරිපූර්ණ වශයෙන් සංවර්ධනය වීම සඳහා දරුවන්ට නිදහස් ව, නිවහල් ව ජීවත්වීමට අවශ්‍ය මංපෙත් විවර ව පැවැතීම අත්‍යවශ්‍ය බව මාගේ විශ්වාසය යි. නමුත් වර්තමානයේ අප රට තුළ ඇතැම් දරුවන් මුහුණ දෙන ඛේදජනක තත්ත්වයන් පසක් කරනුයේ ඉහත අරමුණ ඉෂ්ට කරගැනීමෙහිලා බරපතල සමාජ රික්තයක් පවතින බව ය.

ඉහත අභියෝග ජයග්‍රහණය උදෙසා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පුරෝගාමී මෙහෙවරක් සිදු කරමින් සිටි. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වත්මන් සභාපති මහාචාර්ය මුදිත විදානපතිරණ මහතා ප්‍රමුඛ විද්වත් වෛද්‍ය කණ්ඩායමක් විසින් සම්පාදනය කරන ලද ළමා ආරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ මෙම ග්‍රන්ථය ළමා ආරක්ෂණ ක්ෂේත්‍රයේ නියැලි සියලූ පිරිස් සඳහා ඉතා ප්‍රයෝජනවත් වනු ඇතැයි මම විශ්වාස කරමි.

ළමා අපයෝජන හඳුනා ගැනීම, වළක්වා ගැනීම හා ඒවා කළමනාකරණය කිරීම පිළිබඳ තොරතුරු හා උපදෙස් ඇතුළත් මෙම ග්‍රන්ථය සමාජගත කිරීම ඔස්සේ ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් පොදු ජන සමාජය සවිබල ගැන්වීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරනු ලබන මෙම කාලෝචිත ප්‍රයත්නය අතිශයින් අගය කොට සලකමි.

පියල් නිශාන්ත ද සිල්වා
රාජ්‍ය අමාත්‍ය,
කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය.

## කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමියගේ පණිවිඩය



දරුවන් රටේ ජීවනාලියයි. රටේ අනාගතය තීරණය කිරීමෙහි ලා ඉතාමත් වැදගත් හා ප්‍රබලතම සාධකය වන්නේ දරුවන් ය. එබැවින් දරුවන් සඳහා සුරක්ෂිත සමාජ වටපිටාවක් සකස් කරලීම අප සියලු දෙනාගේ ම යුතුකම හා වගකීම වන්නේ ය.

ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ වැඩිහිටියන් දරුවන් කෙරෙහි දක්වන්නේ ඉමහත් සැලකිල්ලකි. නමුත් වර්තමානයේ මෙම හර පද්ධතීන් අභියෝගයට ලක් කරමින් දරුවන් විවිධ අපයෝජන හා නොසලකා හැරීම්වලට ලක් වන අවස්ථා නිරීක්ෂණය වේ. සියලු දරුවන්ගේ ආරක්ෂාව හා යහ පැවැත්ම තහවුරු කරමින් ඔවුනට ජීවත්වීමට වඩාත් සුරක්ෂිත හා යහපත් පරිසරයක් උදා කරලීමේ දැවැන්ත අභියෝගය ජය ගැනීමේ වගකීම අප සියලු දෙනා වෙත පැවරී ඇත.

මෙම අභියෝගයට මුහුණ දීම සඳහා ළමා ආරක්ෂණ ක්ෂේත්‍රයේ රාජකාරි කටයුතු කරන නිළධාරීන්ගේ මෙන්ම මහජනයාගේ ද දැනුම හා කුසලතා ඉහළ නංවමින් ඔවුන්ව සවිබල ගැන්වීමට අප කටයුතු කළ යුතු ය.
ඉහත කාලීන අවශ්‍යතාවය හඳුනා ගනිමින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වත්මන් සභාපති මහාචාර්ය මුදිත විදානපතිරණ මහතා ප්‍රමුඛ විද්වත් වෛද්‍ය කණ්ඩායමක් විසින් සම්පාදනය කරන ලද ළමා ආරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ මෙම ග්‍රන්ථය ළමා ආරක්ෂණ ක්ෂේත්‍රයෙහි කටයුතු කරන නිලධාරීන්ට හා ප්‍රජාවට ඉතා ප්‍රයෝජනවත් වන බව නොඅනුමාන ය. මෙම ග්‍රන්ථය තුළ ළමා අපයෝජන හඳුනා ගැනීම, වළක්වා ගැනීම හා ඒවා කළමනාකරණය කිරීම පිළිබඳ වටිනා තොරතුරු හා උපදෙස් ඇතුළත් වේ. ලාංකීය දරු පරපුරට සුරක්ෂිත හෙට දිනක් උදාකරලීම සඳහා කැප වී කටයුතු කරන පිරිස් සවිබල ගැන්වීමේ අරමුණින්, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සිදුකළ මෙම කාර්යය බෙහෙවින් අගය කරමි.

කේ. එම්. එස්. ඩී. ජයසේකර
ලේකම්,
කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන,
පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය.

<u>ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ගරු සභාපතිතුමාගේ පණිවිඩය</u>



ශ්‍රී ලංකාව, සෞභාග්‍යමත් දේශයක් ලෙස ගොඩ නැංවීමේ නවමු බලාපොරොත්තු පෙරදැරි ව එම ශ්‍රේෂ්ඨ අරමුණ මුදුන් පමුණුවා ගැනීමේ අභියෝග හා බාධක ජයග්‍රහණය කිරීමේ තීරණාත්මක මාවතකට එළඹ සිටී. මෙම කාර්යයේ දී සමස්ත ශ්‍රී ලාංකේය දරු පරපුර සඳහා සුරක්ෂිත සමාජ වටපිටාවක් ඇති කරලීම අප හමුවේ පවතින දැවැන්ත අභියෝගයකි. දරුවන් දැඩි ව රැකබලා ගන්නා අප සමාජයේ එම අගනා හර පද්ධතීන් අභියෝගයට ලක් ව ඇති අවස්ථාවක, ඔවුන් වෙනුවෙන් සුරක්ෂිත සමාජ වටපිටාවක් සකස් කරලීම වැඩිහිටි අප සියලූ දෙනාගේ ම යුතුකම හා වගකීම විය යුතු ය.

ඒ අනුව ළමා ආරක්ෂණ ක්ෂේත්‍රයේ වගකීම් දරන ආයතනයක් වශයෙන් ළමා ආරක්ෂණ දැනුම සමාජගත කිරීමේ අරමුණු පෙරදැරි ව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමා ආරක්ෂණ ක්ෂේත්‍රයේ රාජකාරි කටයුතු කරන නිලධාරීන්ගේ හා මහජනතාවගේ දැනුම හා කුසලතා ඉහළ නැංවීමේ අරමුණින් මෙම ග්‍රන්ථය සම්පාදනය කරන ලදි.

ළමා අපයෝජන හඳුනා ගැනීම, වළක්වා ගැනීම හා කළමනාකරණය පිළිබඳ මෙම ග්‍රන්ථය ළමා ආරක්ෂණ ක්ෂේත්‍රයෙහි විවිධ පරාසයන්හි කටයුතු කරන නිලධාරීන්ට අවශ්‍ය තොරතුරු හා මගපෙන්වීම් සපයයි. ළමා අපයෝජන යනු කවරේ ද, එය හඳුනා ගන්නා ආකාර, ළමා අපයෝජන සිද්ධියක් කළමනාකරණයට අදාළ ආයතන හා නිලධාරීන් සහ ඊට අදාළ අත්‍යවශ්‍ය මෙහෙයුම් තොරතුරු මෙහි ඇතුළත් ය. මෙම තොරතුරු සාමාන්‍ය මහජනතාවට ද ඉතා ප්‍රයෝජනවත් වනු ඇතැයි මාගේ විශ්වාසය යි.

විශේෂඥ අධිකරණ වෛද්‍යවරුන් වන විශේෂඥ වෛද්‍ය ශ්‍රියන්ත අමරරත්න හා විශේෂඥ වෛද්‍ය රොහාන් රුවන්පුර, ළමා මානසික රෝග විශේෂඥ වෛද්‍ය ස්වර්ණා විජේතුංග හා මානසික රෝග විශේෂඥ වෛද්‍ය බුද්ධි ජයසේකර යන වෛද්‍ය ක්ෂේත්‍රයේ ළමා ආරක්ෂණයට අදාළ විවිධ කටයුතුවල නිමග්න විද්වත් වෛද්‍යවරුන් කණ්ඩායමකගේ දායකත්වය ද මෙම ග්‍රන්ථ සම්පාදනය සඳහා යොදා ගන්නා ලදි. වසර ගණනාවක වෙහෙසකර වෘත්තීය ජීවිතයේ අප ලද අත්දැකීම් හා අප අධිකාරියේ වර්තමාන කාර්යභාරයට අදාළ තොරතුරු ආශ්‍රිත ව හඳුනා ගත් නවමු ළමා ආරක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු ද ඇතුළත් කරමින් මෙම ග්‍රන්ථය රචනා කිරීමට සම්පත් දායකත්වය ලබා දීමට හැකි වීම අපි ලද භාග්‍යයක් කොට සලකමු. මෙම ග්‍රන්ථය ග්‍රන්ථය එළි දැක්වීම සඳහා නන් අයුරින් වෙහෙස වූ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සියලු නිලධාරීන්ට හා අනෙකුත් සියලූ දෙනා වෙත මාගේ හද පිරි ස්තුතිය පළ කර සිටිමි. දැයේ දරුවන්හට සුරක්ෂිත හෙට දිනක් ගොඩ නැංවීමේ උදාරතර පරිශ්‍රමයන්හි කැප වී සිටින ඔබ සියලූ දෙනාගේ කටයුතු සිදු කිරීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ලැබේවා යි ප්‍රාර්ථනා කරමි.

මහාචාර්ය මුදිත විදානපතිරණ
MBBS (Col), DLM (Col),MD (Col), MA (SJP), FFFLM (UK)
සභාපති,
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

පටුන

ළමා අපයෝජන හඳුනා ගැනීම, කළමනාකරණය
හා වැළැක්වීම 1
(1) ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 1
(2) ළමා අපයෝජනය යනු කුමක්ද ? 8
(3) ළමා අපයෝජන වර්ග 10
(4) ළමා අපයෝජන නිසා දරුවන් මුහුණපාන ගැටලු 13
(5) ළමා අපයෝජන සම්බන්ධයෙන් ක්‍රියා කරන ආයතන 14
5.1. පවුල් මට්ටම 14
5.2. ප්‍රජා මට්ටම 15
5.3. ප්‍රාදේශීය මට්ටම 15
5.4. දිස්ත්‍රික් මට්ටම 15
5.5. ජාතික මට්ටම 16
5.6. අන්තර්ජාතික මට්ටම 16
(6) ළමා අපයෝජන හඳුනා ගැනීම 17
6.1. ඉතිහාසයෙන් ලබා ගතහැකි තොරතුරු 17
6.2. රෝග ලක්ෂණ මගින් ලබා ගතහැකි තොරතරු 17
6.3. හැසිරීමෙන් හා මානසික සෞඛ්‍යයෙන්
ලබා ගතහැකි තොරතුරු 17
6.4. ලිංගිකතාවයට අදාළ වූ අසාමාන්‍ය හැසිරීම 18
6.5. සමාජයීය තොරතුරු මගින් ලබා ගතහැකි කරුණු 18
1) අනාරක්ෂිතපවුල්/ළමයින් 18
2) අවදානම් ළමයින් 18
3) ආන්තික ළමයින් 19
4) ඇස නොගටෙන ළමයින් 19
5) ළමා ආරක්ෂණය පිළිබඳ අවසන් තක්සේරුව 19
6.6. සායනික පරික්ෂාවේදී ලබා ගතහැකි තොරතුරු 19
6.7. මානසික ඇගයීමෙන් ලබාගත හැකි තොරතුරු 20
6.8. ළමයා විසින් ලබාදෙන ඉතිහාසය මත 20
(7) ළමා අපයෝජන කළමනාකරණය 21
7.1. බහු ආංශික කළමනාකරණය - 21
7.2. ළමයා රෝහල්ගත කිරීම තීරණය කරන අයුරු 22
7.3. දිස්ත්‍රික්/ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරියාගේ හා
දිස්ත්‍රික් මනෝ සමාජීය නිලධාරියාගේ වගකීම 25
7.4. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින්ගේ වගකීම 34
7.5. පරිවාස නිලධාරියාගේ කාර්යභාරය 34

7.6. ඔබේ වගකීම 35
7.7. පොලිස් නිලධාරියාගේ වගකීම 35
7.8. නීතිපති දෙපාර්තමේන්තුව - නීති නිලධාරින්ගේ වගකීම 38
7.9. අධිකරණය 38
7.10. අධ්‍යාපන අමාත්‍යංශයේ නිලධාරින්ගේ වගකීම 39
7.11. මාධ්‍යවේදීන්ගේ වගකීම 39
(8) ළමා හිංසනයට අදාළ නීති 40
(9) ළමා අපයෝජන වැළැක්වීමට ගතහැකි පියවර 47
Annexures 50

## ළමා අපයෝජන හඳුනා ගැනීම, කළමනාකරණය හා වැළැක්වීම

### (1) ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

වසරකට ලෝකයේ ළමයින් විශාල සංඛ්‍යාවක් (බිලියන එකක් (01) පමණ) ළමා අපයෝජනයට ලක්වන අතර,[1] එම හේතුව නිසා වසරකට ළමයින් 50,000 ක් පමණ මිය යයි. වර්ෂ 2020 වන විට ශ්‍රී ලංකාවේ වෙසෙන මුළු ළමයින් සංඛ්‍යාව ලක්ෂ 60 ඉක්මවන අතර, එය මුළු ජනගහනයෙන් 1/3 ක් පමණ වේ. ඉන් වයස අවුරුදු 5 ට අඩු ළමයින් සංඛ්‍යාව ලක්ෂ 18 ක් වන අතර[2] අවුරුදු 5 සිට 18 අතර ළමයින් සංඛ්‍යාව ලක්ෂ 46 කි.[3]

ළමා අපයෝජනය ඕනෑම සංස්කෘතියක, ඕනෑම පංතියක හෝ ඕනෑම පවුලක සිදුවිය හැකිය. ශ්‍රී ලංකාවේ 2011-2014 වසර 4 තුළ සිදු වී ඇති ළමා අපයෝජන සංඛ්‍යාව 32,000 ඉක්මවයි. නමුත් 2019 වර්ෂයේ දී පමණක් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබුණු ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි සංඛ්‍යාව 8558 ක් වූ අතර,[4] එම වසරේ දී ශ්‍රී ලංකා පොලීසියට වාර්තා වී ඇති පැමිණිලි සංඛ්‍යාව 5130 කි.[5]

ළමා අපයෝජන ගැන හඳුනා ගැනීමට පෙර ළමයා යනු කවරෙක්දැයි වටහා ගැනීම වටී. ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂක පනතට අනුව ළමයෙකු යනු වයස අවුරුදු 18 ට අඩු තැනැත්තෙකි.[6] ඒ අනුව ළමයා යනු අප සංස්කෘතිය තුළ මාපිය ආදරය අපේක්ෂා කරන, මාපියන්ගේ කරුණාව හා දයාව ලැබිය යුතු අයෙකු මෙන්ම සමාජයේ ආරක්ෂාවට ලක්විය යුතු අයෙකු බව ද පෙනී යයි. තවද, මොවුන් ළමුන් ලෙස නිර්වචනය කරනු ලබන්නේ වැඩිහිටියන්ගේ ආධාර හා උපකාර මත ජීවත් වන නිසයි. කෙසේ නමුදු වර්තමානයේ ළමා කාලය නිසි පරිදි ගත කිරීමට අවශ්‍ය පහසුකම් ඔවුන්ට ලැබී ඇත්දැයි සැකයක් මතුවී ඇත.

එක්සත් ජාතීන්ගේ සංවිධානය ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය 1989 දී සිය සාමාජිකයින් වෙත ඉදිරිපත් කරන ලදී.[7] මෙය ලොව පුරා විසිර සිටින සියලුම ළමයින් අයිතිවාසිකම් හිමි පිරිසක් ලෙස හඳුන්වා දීම සඳහා ඉදිරියට තබන ලද

---

1. WHO - https://www.who.int/news-room/fact-sheets/detail/violence-against-children
2. Registrar General Department 2017, http://www.rgd.gov.lk/web/index.php/en/12-downloads.html
3. Child activity survey, 2016, https://www.ilo.org/colombo/info/pub/pr/WCMS_545872/lang--en/index.htm
4. NCPA Annual data 2019
5. NCPA Annual data 2019
6. National Child Protection Authority Act (No. 50 of 1998)

07. http://www.commonlii.org/lk/legis/num _act/ncpaa50o1998429/

පියවරකි. ළමයින්ට අයිතිවාසිකම් හිමිකර දීම වෙනුවෙන් සිය කැපවීම පළකළ ලෝක ප්‍රජාවට ශ්‍රී ලංකාව 1991 දී එකතු විය.

ශ්‍රී ලංකාව ද්විත්ව ක්‍රමය (Dualism) අනුගමනය කරන රටක් හෙයින් මෙලෙස එකගව අත්සන් තබා තහවුරු කරන ජාත්‍යන්තර බැඳියාවන් එනයින් ම ශ්‍රී ලංකාව තුළ බලාත්මක වීමක් සිදු නොවෙයි.[8] ශ්‍රී ලංකා ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුව විසින් ව්‍යවස්ථා සම්මත කර ගැනීම හරහා පමණක් ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ දැක්වෙන අයිතිවාසිකම් රට තුළ බලාත්මක කිරීමත්, ලංකාවේ දරුවන්ට එම අයිතිවාසිකම් හිමිකර දීමත් සිදු කරනු ලැබේ. ඊට අමතරව උපරිමාධිකරණ නඩු තීන්දු හරහා ද ළමා අයිතිවාසිකම් පිළිබඳ නීති රට තුල බලාත්මක කිරීම සිදු කරනු ලැබේ. .

ප්‍රඥප්තියේ දැක්වෙන වගන්ති 54 න් පළමු වගන්ති 40 ක් පුරා ළමයින්ට එමගින් හිමි කරදෙන අයිතිවාසිකම් විස්තර කෙරෙන අතර අනෙක් වගන්ති මගින් රාජ්‍ය පාර්ශවයන් වෙත පැවරෙන වගකීම ඉටුකරන ආකාරය පිළිබඳව දක්වා ඇත.[9] ළමයින්ට හිමි කර දෙන මෙම අයිතිවාසිකම් (1) ජීවත්වීමට, (2) වර්ධනයට, (3) සහභාගි වීමට සහ (4) සියලුම ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා වීමට යනුවෙන් සරලව ප්‍රධාන කොටස් 4 කට වෙන්කර දැක්විය හැකිය.

ප්‍රඥප්තියේ පැහැදිලිව දක්වා ඇති ළමා අයිතිවාසිකම් හිමිකර දීම වෙනුවෙන් විධිමත්ව නව ක්‍රමවේදයන් හඳුන්වා දීමටත් පවත්නා ක්‍රමවේදයන් යථාවත් කිරීමටත් ශ්‍රී ලංකා රජයන් විටින්විට පියවර ගෙන ඇත. 1995 දී එවකට සිටි ජනාධිපතිනිය විසින් ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගේ දායකත්වයෙන් පිහිටුවන ලද[10] ළමා අපයෝජන වැළැක්වීම පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බලකායේ නිර්දේශයක් ලෙස කෙටුම්පත් කෙරුණු ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත 1998 දී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.
පනතේ පූර්විකාවෙහි මනාව පැහැදිලිව දක්වන පරිදි මෙම පනත මගින් ව්‍යවස්ථාදායකය අපේක්ෂා කරන ලද්දේ ළමා අපචාර වැළැක්වීම සහ එවැනි අපචාරවලට ගොදුරු වූ ළමයින් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිණිස ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කාර්යය සහ සියලු ආකාරයෙන් වූ ළමා අපචාරවලට එරෙහි වූ ක්‍රියා මාර්ග සම්බන්ධීකරණය හා නියාමනය කිරීම, ඒ හා සම්බන්ධ හෝ එහි ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියක් පිහිටුවීමයි. මෙමගින් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ දැක්වෙන සියලුම ආකාරයේ අපයෝජනයන්ගෙන්

---

08. Tag Archives: Dualism in Sri Lanka. Cases SL: Supreme Court Case on Nallaratnam Singharasa (Full Judgement). https://ruwanthikagunaratne.wordpress.com/tag/dualism-in-sri-lanka/
09. Child right convention.1989. https://www.ohchr.org/documents/professionalinterest/crc.pdf
10. Presidential Task force to prevent child abuse in SL.http://www.childprotection. gov.lk/ ?page _id=29

ආරක්ෂා වීමට ළමයාට ඇති අයිතිය සුරක්ෂිත කරදීම වෙනුවෙන් ශ්‍රී ලංකා රජයේ වගකීම තහවුරු කිරීම අරමුණ විය.

1995 දී අපරාධ පිළිබඳව හරායාත්මක නීතියට හා කාර්ය පටිපාටික නීතියට හඳුන්වා දුන් සංශෝධන මගින් ළමයා යන්නට ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ නිර්වචනයට අනුකූල වන නිර්වචනයක් හඳුන්වා දීමත් ළමයින්ට එරෙහි නව අපරාධ වැරදි හඳුන්වා දීමත් ළමයින්ට එරෙහිව අපරාධ සඳහා වරදකරුවකු වන්නකු හට හිමිවන දඬුවම් ඉහල දැමීමත් සිදුවිය.[11]

දණ්ඩ නීති සංග්‍රහයේ 286අ, 288, 288අ, 288ආ, 308අ, 360අ, 360ආ, 360ඇ, 363, 364අ, 365, 365අ හෝ 365ආ යන වගන්තිවල කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීමක් ළමයෙකුට අදාළව සිදු කිරීම ළමා අපචාර ලෙස 1998 අංක 28 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහය පනත සංශෝධනය මගින් හඳුන්වා දෙන ලදි.

1998 දී ව්‍යවස්ථාදායකය විසින් අපරාධ නඩු කටයුතු සඳහා වන කාර්ය පටිපාටික නීතියට කළ සංශෝධනයේ දී, එනම් 1998 අංක 28 දරණ සංශොධන පනතේ දී ළමා අපචාර යන පදය, දණ්ඩ නීති සංග්‍රහයයේ දැක්වෙන අපරාධමය වරද ආශ්‍රිතව නිර්වචනය කොට දැක්වූව ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ ළමා අපචාර යන්නට දණ්ඩ නීති සංග්‍රහයේ ඉහත වගන්තිවල කවර හෝ විධිවිධාන උල්ලංඝනයෙන් ඔබ්බට ගොස් ඉතා පුළුල් පරාසයකට විහිද යාමක් ව්‍යවස්ථාදායකයේ අපේක්ෂාව වූ බව පෙනේ.[12] ඒ අනුව ළමා අපචාර ලෙසින් ස්ත්‍රීන්, යෞවනයින් සහ ළමයින් සේවයෙහි නියුක්ත කිරීමේ පනතේ කවර හෝ වීධි විධානයක්, ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනතේ කවර හෝ විධිවිධානයක් නැතහොත් අධ්‍යාපන ආඥාපනත යටතේ සාදන ලද අනිවාර්ය අධ්‍යාපනයට අදාළ නියෝගවල කවර හෝ විධිවිධානයක් උල්ලංඝනයක් ද ඇතුළත් කර තිබීම දැක්විය හැකිය.

1998 අංක 50 දරණ පනත යටතේ අධිකාරියක් පිහිටුවන්නේ පනතේ පූර්විකාවේ ද දැක්වෙන ජාතික ප්‍රතිපත්තිය සකස් කර සියලුම ආකාරයේ ළමා අපචාර වැළැක්වීමට, සියලූ ආකාරයෙන් වූ ළමා අපචාරවලට එරෙහි වූ ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය හා නියාමනය කිරීම හා ඒ සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ය.

1998 දි ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවීම සදහා ව්‍යවස්ථාදායකය පියවර ගන්නා විට දී ළමා අපචාර නිර්වචනයට පසුබිම සකසන ව්‍යවස්ථා/රෙගුලාසි 4 ම බලාත්මක කිරීමේ කටයුතු අදාළ ව්‍යවස්ථා මගින් පිහිටුවන ලද රාජ්‍ය යාන්ත්‍රණය හරහා ක්‍රියාත්මක වෙමින් පැවතුනි. එනම් දණ්ඩ

11.Penal Code (Amendment) Act (No. 22 of 1995). http://www.commonlii.org/lk/legis/num_act /pca22o 1995213/

12.Code Of Criminal Procedure (Amendment) Act (No. 28 of 1998) http://www.commonlii. org/lk/ legis/ num act/ cocpa28o1998356/

නීති සංග්‍රහයේ විධිවිධාන පොලිස් දෙපාර්තමේන්තුව ද, ස්ත්‍රීන් යෞවනයින් සහ ළමයින් සේවයෙහි නියුක්ත කිරීමේ පනතේ විධිවිධාන කම්කරු දෙපාර්තමේන්තුවද,[13] ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනතේ විධිවිධාන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව හා පොලිස් දෙපාර්තමේන්තුවද,[14] අනිවාර්ය අධ්‍යාපනයට අදාළ නියෝගවල විධිවිධාන අධ්‍යාපන දෙපාර්තමේන්තුවද, බලාත්මක කරමින් පැවතුනි. පැහැදිලිවම 1998 දි මෙම අංක 50 දරණ පනත පැනවීම හරහා පාර්ලිමේන්තුව අපේක්ෂා කළේ අධිකාරිය පනතේ ළමා අපචාර නිර්වචනයට ඇතුළත් වූ ඉහත කී පනත් 4 ක්‍රියාත්මක කෙරෙන ආකාරය නියාමනය කිරීම තුළින් මේ සියලුම ආකාරයේ ළමා අපචාර වැළැක්වීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමයි.

අධිකාරියේ කර්තව්‍යයන් 14 වගන්තියේ (අ) සිට(ණ) දක්වා වූ උප වගන්ති 19 කින් දැක්වේ. මෙම 14 වගන්තියෙහි දැක්වෙන කර්තව්‍ය ප්‍රධාන ක්ෂෙත්‍ර කිහිපයකට වෙන් කළ හැකියි. ආණ්ඩුවට උපදෙස් දීම (අ,ආ,ඇ) නිර්දේශ කිරීම(ඊ,එ),නියාමනය කිරීම (උ,ඌ,ග)දැනුවත් කිරීම, අධ්‍යාපනය ලබා දීම, තොරතුරු සැපයීම, සංවාදයේ යෙදීම, වැඩමුළු සම්මන්ත්‍රණ සංවිධානය (ඈ,ජ,ට,ඩ), උපදෙස් දීම හා උපදෙස් විමසීම, සම්බන්ධීකරණය (ණ,ච) මින් ප්‍රධාන කර්තව්‍ය කිහිපයකි. ළමා අපචාර පිළිබඳ ජාතික දත්ත පදනම පවත්වා ගෙන යාම, ළමා අපචාර පිළිබඳ මහජන පැමිණිලි භාර ගැනීම සහ නිසි බලධාරීන් වෙත ඒවා යොමු කිරීම, අපරාධ පිළිබඳ විමර්ශනයට හා අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමුන්ගේ ආරක්ෂාව හා රැකවරණය වෙනුවෙන් උචිත පියවර ගැනීම මෙන්ම අධිකාරී පනතේ 14(ඉ) මගින් ළමා අපචාර වැලැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අයෝජනවලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැක ගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම ද අධිකාරියේ සුවිශේෂී කර්තව්‍යයන් ලෙස මේ අතර ප්‍රමුඛතාව ගනී.

අධිකාරියේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය බලතල පනතේ 15 වගන්තිය දැක්වෙන අතර ඊට අමතරව සියලු ආකාරයෙන් වූ ළමා අපචාරවලට එරෙහි වූ ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය හා නියාමනය කිරීමේ කටයුතු විධිමත්ව කරගෙන යාම සඳහා අවශ්‍ය වන විශේෂිත බලතල ද 1998 අංක 50 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ පැහැදිලිව දක්වා ඇත.

---

13. Employment of women, young persons and children. https://www.ilo.org/dyn/travail/docs/1658/EMPLOYMENT %20OF%20WOME

14. Children and young persons ordinance. http://socialproba.cp.gov.lk/download/ord_1939_48_en.pdf

අධිකාරියේ කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා අවශ්‍යවන ළමයින් හා සම්බන්ධ යම් කටයුතුවලට අදාළ සියලු වාර්තා හා තොරතුරු, එම තොරතුරු සන්තකයේ පවතින අයගෙන් හෝ එම තොරතුරු දන්නා අයගෙන් කැඳවීමට බලයක් අධිකාරිය පනතේ 24 වගන්තිය සතුවේ. මෙලෙස කෙරෙන යම් නියමයක් අනුව තොරතුරු සැපයීම පැහැර හරින හෝ දැන දැනම අසත්‍ය ප්‍රකාශ කරන සෑම තැනැත්තෙක්ම මෙම පනත යටතේ වරදක් කරන අතර ඒ පිළිබඳව මහේස්ත්‍රාත් අධිකරණයක පැවරෙන නඩුවේ දී වරදකරුවකු වන අයකුට රු. 5000/= දඩයක් හෝ මාස 06 ක බන්ධනාගාරගත කිරීමක් හෝ මේ දෙකම හෝ හිමිවිය හැකි බව වැඩිදුරටත් පනතේ 37 වන වගන්තියේ දක්වා ඇත.

බලයලත් නිලධාරි පත්කිරීම හා බලයලත් නිලධාරියාගේ බලය පිළිබඳ නෛතික ප්‍රතිපාදන පනතේ 33 සිට 36 දකවා වගන්තිවල සඳහන්ව ඇත. ළමා අපචාර කටයුතු යම් පරිශ්‍රයක සිදු කෙරෙන බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු අධිකාරියට ඇති අවස්ථාවක හා සෝදිසි වරෙන්තුවක් සඳහා අධිකරණයෙන් ඉල්ලීමක් කිරීම එම ළමා අපචාර විමර්ශනයට හානිකර විය හැකි බව විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති අවස්ථාවක එවැනි පරිශ්‍රයකට ඇතුළු වී පරීක්ෂා කිරීම සඳහා සිය නිලධාරියකුට බලය දීමට 1998 අංක 50 දරණ පනතේ 33 වගන්තිය යටතේ අධිකාරියට බලතල ලබා දී ඇත. තවද පනතේ 34(1)(අ) වගන්තිය යටතේ එලෙස බලය ලද නිලධාරියාට ළමා රැකවරණ සේවා සපයන කවර හෝ ආයතනයක පරිශ්‍රයට ඇතුළු වී එය පරීක්ෂා කළ හැකිය. මෙම බලයලත් නිලධාරි වෙත පවරා ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ දී ඊට බාධා කිරීම වරදක් වන අතර වගන්තිය 34(2)(1) යටතේ ඒ පිළිබඳව මහේස්ත්‍රාත් අධිකරණයක පැවරෙන නඩුවේ දී වරදකරුවකු වන අයකුට රු. 1000/= නොවැඩි දඩයකට හෝ මාස 6 කට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමක් හෝ මේ දෙකම හෝ හිමිවිය හැකිය. පනතේ 35 වගන්තිය යටතේ, එසේම එම ආයතනය පවත්වා ගෙන යන ලේඛන පරීක්ෂා කොට උද්‍ධෘත හෝ පිටපත් ලබා ගත හැකිය. පරිශ්‍රයේ සිටින්නන් ප්‍රශ්ණ කළ හැකිය. භාණ්ඩ තහනමට ගැනීමට ද හැකිය. පනතේ 36 වගන්තිය යටතේ, මෙම "බලයලත් නිලධාරි" අපරාධ නඩු විධාන සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කටයුතු සඳහා සාම නිලධරයන් ලෙස සැලකෙන බව පනත දක්වයි.

තවද ළමයින්ට අදාළ නීති යටතේ වැරදි සමබන්ධයෙන් නඩු පැවරීමේ කාර්යය සඳහා මූල මණ්ඩලයේ නිලධාරියෙකු හෝ අධිකාරිය විසින් ලිවිල්ලක් මගින් බලය දෙනු ලැබූ නිලධාරියෙකු හෝ සේවකයෙකු 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 136 වන වගන්තියේ අර්ථානුකූලව රජයේ නිලධාරියෙකු ලෙස සලකනු ලැබිය යුතු බව මෙම පනතේ 37 (4) මගින් පැහැදිලි කරයි.

පනතේ 23 වගන්තිය අනුව අධිකාරියේ සෑම සාමාජිකයකුම හා සේවකයකුම සිය කාර්යය ආරම්භයට පළමුව අධිකාරියේ කටයුතු හා සම්බන්ධ සියලූ කරුණු පිළිබඳව දැඩි රහස්‍යභාවයක් පිළිපදින බවට ප්‍රතිඥාවක් දෙනු ලබන අතර එම තොරතුරු හෙළිදරව් කිරීමට අධිකාරි පනතින් බලය දී නොමැති කාර්යයක් සඳහා වෙනත් තැනැත්තෙකුට හෙළිදරව් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් ලෙස පනතේ 37 වගන්තියේ සඳහන්ව ඇත.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 29 වන වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් හෝ අධිකාරියේ විධානය මත හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ක්‍රියාවන්ට එරෙහිව අධිකාරිය ටත් අධිකාරියේ සාමාජිකයෙකුට, නිලධරයෙකුට හෝ සේවකයකුට විරුද්ධව සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු ලැබිය නොහැකිය. තවද අධිකාරියට එරෙහිව පැවරූ කිසිම නඩුවක දී එහි සාමාජිකයෙකුට හෝ නිලධරයකුට හෝ සේවකයෙකුට හෝ විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බවටද දැක්වේ.

මෙලෙස ක්‍රියාත්මක වන ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන්, පනතේ 03 වන වගන්තිය අනුව, වසර 3 ක ධූර කාලයක් සඳහා ජනාධිපතිවරයා විසින් පත් කිරීම් සිදු කරයි. සෞඛ්‍ය, අධිකරණ, ආරක්ෂක යන විශය භාර අමාත්‍යවරයින් විසින් කරන නාම යෝජනා මෙන්ම නීතිය, ළමා සුභසාධනය අධ්‍යාපනය හෝ වෙනත් ඒ හා සම්බන්ධ ක්ෂේත්‍රයක පුළුල් පළපුරුද්දක් සාමර්ථයක් හා පිළිගැනීමක් ඇතැයි ජනාධිපතිවරයාට පෙනීයන 5 දෙනෙකු ද සාමාජිකයින් ලෙස පත් කෙරෙනු ඇත. මෙම සාමාජිකයන්ට තවත් එක් ධූර කාලයක් සඳහා පත් කරනු ලැබිය හැකිය. අධිකාරියේ සාමාජිකයකු ලෙස නිලබලයෙන් පත්වන තිදෙනෙක් ද වේ. එනම් පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස්වරයා, කම්කරු කොමසාරිස්වරයා සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ කමිටුවේ සභාපතිවරයාය. ජනාධිපතිවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයෙකු අධිකාරියේ සභාපති ධූරයට පත් කරනු ලැබිය හැකි අතර ජනාධිපතිවරයා විසින් නම් කරනු ලබන වෙනත් සාමාජිකයකෙු නියෝජ්‍ය සභාපති ලෙස පත් කරනු ලැබිය හැකිය.

පනතේ 16 වගන්තිය අනුව, ළමා ආරක්ෂාවට සෘජුවම අදාළවන විෂයයන් 10 ක් වන අධිකරණ, අධ්‍යාපන, ආරක්ෂක, සෞඛ්‍ය, සමාජ සේවා, පලාත් සභා, කාන්තා කටයුතු, කම්කරු, සංචාරක හා මාධ්‍ය යන විශය භාර අමාත්‍යංශයන්හි අමාත්‍ය ලේකම් විසින් නම් කළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ගෙන් සමන්විත නිලධාරි මූල මණ්ඩලයක් (Panel members) ද අධිකාරිය සතුවේ. අධිකාරියේ සෑම රැස්වීමකටම සහභාගි විය යුතු මෙම මූල මණ්ඩල නිලධාරින් අධිකාරියේ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරියටසහාය විය යුතුවේ.

1998 අංක 50 දරණ පනත යටතේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත සංශෝධනය කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කොට ඇති අතර මේ වන විට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය දැයේ ළමයින් වෙත සිදු කරනු ලබන ඉමහත් සේවාවට අමතරව, යෝජිත සංශෝධන මගින් අපචාරවලට ගොදුරු වන ළමයින්ගේ සුභසිද්ධිය සඳහා විශාල කාර්යභාරයක් ඉටු කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ඒකායන ප්‍රාර්ථනයයි.

## (2) ළමා අපයෝජනය යනු කුමක්ද ?

ළමා අපයෝජන නූතනයේ විශාල සමාජීය ගැටලුවක් ලෙස සැළකේ. ළමයෙකුගේ කායික හා මානසික තත්ත්වයන්ට පිටස්තරව, ඔහුගේ හෝ ඇයගේ යහපතට හා මනා කල්ක්‍රියාවට එරෙහිව සිදු කරන කුමන හෝ අයහපත් ක්‍රියාවක් ළමා අපයෝජනයක් ලෙස "නිදහස් විශ්වකෝෂය" හඳුන්වයි.[15]

එය සරලව පැහැදිළි කළහොත් ළමයින් කෙරෙහි අනර්ථයක් සිදුවන ආකාරයෙන් සැලකීම හෝ ක්‍රියා කිරීමයි. මෙම ළමා අපයෝජන නොසැලිකිලිමත් බව, කායික, මානසික, ලිංගික හා ළමා මෙහෙකාර සේවය යනාදී ලෙස දැකිය හැකිය. ළමයින් ව නොසලකා හැරීම කායික වශයෙන් සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවන් හා ළමයින්ට සිදුවන ලිංගික අතවර මෙහිදී ප්‍රධාන ස්ථානයක් ගනු ලැබේ.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ (1999) නිර්වචනයට අනුව ළමා අපයෝජනය යනු ළමයාගේ භාරකරුවන් හෝ විශ්වාසවන්තයන් හෝ වගකීමක් ඇති පුද්ගලයන් විසින් කායික, මානසික, ලිංගික අපයෝජනය හෝ නොසැලිකිලිමත්කම හෝ වාණිජමය සූරාකෑම හා අනෙකුත් අපයෝජනයන් නිසා ළමයෙකුගේ සෞඛ්‍ය වර්ධනය හෝ ආත්මයට හානිවන අයුරින් කටයුතු කිරීමයි.[16]

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 40 වන අංගයට අනුව ළමා අපයෝජනය යන්න ශ්‍රී ලංකාව සඳහා නිර්වචනය කර ඇත. ඒ අනුව, ළමා අපයෝජනය යන්නෙන් අදහස් වන්නේ,[17]

(අ) දණ්ඩ නීති සංග්‍රහයේ පහත සඳහන් විධිවිධාන 13 ක් උල්ලංඝනය කිරීම

01. 286 A : ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය පළ කිරීම්, ප්‍රදර්ශනය ආදිය (ළමයින්ගේ අසභ්‍ය හෝ අශ්ලීල ප්‍රකාශන,

02. 288 : ළමයින්ට සිගාකෑමට සැලැස්වීම හෝ කුට්ටනය කිරීම,

03. 288 A : ලිංගික සංසර්ගය සඳහා කුට්ටනියකු වශයෙන් ක්‍රියාකිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම,

04. 288 : සීමිත භාණ්ඩ (මත් ද්‍රව්‍ය) ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයෙහි යෙදවීම,

---

[15]Definition of child abuse. https://www.thefreedictionary.com/ch ild+ abuse

[16] Report of the Consultation on Child Abuse Prevention, 29–31 March 1999, WHO, Geneva. Geneva, World Health Organization, 1999 (document WHO/HSC/PVI/99.1). https://www.who.int/violence_injury_ prevention/ violence/global campaign/en/chap3.pdf

[17] National Child Protection Authority Act (No. 50 of 1998) – (Sinhala) Sect 40 http://www.commonlii.org /lk/legis/num_act/ncpaa50o1998429/s39.html

05. 308 A : ළමයින් කායික හෝ මානසික කෘරත්වයට භාජනය කිරීම,
06. 360 A : කුට්ටනය,
07. 360 : ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම,
08. 360 : තැනැත්තන් වෙළඳාම් කිරීම,
09. 363 : ස්ත්‍රී දූෂණය,
10. 364 A : ව්‍යභිචාරය,
11. 365 : අස්වාභාවික වැරදි,
12. 365 : තැනැත්තන් අතර දැඩි අශික්ෂිත ක්‍රියා
13. 365 : බරපතල ලිංගික අපයෝජනය

යන වගන්තිවල කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීම හෝ
(ආ) ස්ත්‍රීන්, තරුණයින් සහ ළමයින් සේවයේ නියුක්ත කිරීමේ පනතේ කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීම[18] හෝ

(ඇ) ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥාපනතේ කවර හෝ විධිවිධනයක් උල්ලංඝනය කිරීම[19]හෝ

(ඈ) අධ්‍යාපන ආඥාපනත යටතේ සාදන ලද අනිවාර්ය අධ්‍යාපනයට අදාළ නියෝගවල කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීම[20]හෝ
ළමයකු සන්නද්ධ ගැටුමකට සම්බන්ධ කර ගැනීම (358A) වැනි ළමයාගේ ජීවිතයට අන්තරායක් ඇති හෝ ඒ ළමයාට ශාරීරික වශයෙන් හෝ ඔහුගේ හැඟීම්වලට හානි සිදු වීමට ඉඩ ඇති පරිදිළමයකුට අදාළව යම් ක්‍රියාවක් සිදු කරනු ලබන්නාවූ හෝ නොකර හැරීමක් එයට ඇතුළත් වේ.

---

18 Employment of women, young persons and children (Amendment) Act No. 24 of 2006. https:// www.srilankalaw. lk /YearWisePdf/2006/EMPLOYMENT_OF_WOMEN,_YOUNG_PERSONS_AND CHILDREN_(AMENDMENT)_ACT,_No. _24_OF_2006.pdf

19 1939 No 48 Children and young person’s Ordinance. https://www.srilankalaw.lk/Volume-II/children-and- young-persons-ordinance.html

20 Extra ordinary Gazette notification 1963/30, 20.04.2016. http://www.documents.gov.lk /files/egz/ 2016/4/1963-30_S.pdf

# (3) ළමා අපයෝජන වර්ග

## 3.1. කායික අපයෝජන

ළමයින්ට එරෙහිව සිදු කරනු ලබන කායික හිංසන ක්‍රියාවන් අපරාධ නීතිය හෝ වෙනත් නීති සංග්‍රහයක් මගින් වරදක් ලෙස සැලකීම තුළින්ම මෙවැනි ක්‍රියාවන් අපරාධ ගණයට වැටෙයි. උවමන්වෙන්ම යම් ළමයකුට අඩන්තේට්ටම් (Assault) කිරීමෙන්, හිංසා කිරීමෙන් (ill - treatment), නොසලකා හැරීමෙන් (Neglect) හා අතරමං කරනු ලැබීමෙන් ළමයකු කායිකව අපයෝජනයට ලක් කල හැක.

## 3.2. ලිංගික අපයෝජන

ළමුන්ට එරෙහිව සිදුවන අපයෝජන තත්ත්වයන් අතුරින් ලිංගික අපයෝජන බරපතල ගැටලුවක් ලෙස නූතනයේ හඳුනාගෙන ඇත. වර්තමානයේ ලෝකයේ සෑම රටක්ම පාහේ ළමයින්ට එරෙහි ලිංගික අපයෝජනය අපරාධයක් හෝ වරදක් ලෙස අර්ථ දක්වා තිබීමෙන්ම එහි ඇති බරපතල තත්ත්වය පැහැදිලි වේ.

කිසියම් පුද්ගලයෙකු විසින් ලිංගික ක්‍රියාවන් සඳහා දරුවකු යොදා ගැනීම ළමා ලිංගික අපයෝජන ලෙස සරලව හැඳින්විය හැකිය. නමුත් නූතනයේ ළමා ලිංගික අපයෝජනය වඩා සංකීර්ණ ස්වභාවයක් ගන්නා අතර, ඊට හේතුවන්නේ වර්තමානයේ ලිංගික අපයෝජන විවිධ ස්වරූපයෙන් ක්‍රියාත්මක වීමයි. උදාහරණයක් ලෙස අද ළමයින් අන්තර්ජාලය හරහා ද ලිංගික අපයෝජනයට ලක් වෙයි. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ සඳහන් දණ්ඩ නීති සංග්‍රහයේ වැරදි 13 න් 10 ක්ම (288, 288B හා 308A හැර) ලිංගික අපයෝජනයන් වෙයි.

## 3.3. මානසික අපයෝජන

ළමා අපයෝජන ක්‍රියා ශාරිරික අපයෝජනයට පමණක් සීමා නොවන අතර, ශාරීරිකව කරන හිංසා කිරීම්වලින් තොරව මානසික වශයෙන් ද අපයෝජන සිදු වේ. කායික අපයෝජන මෙන් නොව, චිත්තවේග (Emotional) හෙවත් චෛතසික වශයෙන් සිදුවන අපයෝජන හඳුනා ගැනීම අපහසු නිසා මේ තත්ත්වය සනාථ කිරීම අපහසු වේ.

මෙවැනි දරුවන් තුළින් දැකිය හැකි ලක්ෂණ වන්නේ

1. දරුවාගේ වයසට නොගැලපෙන කටයුතු මෙන්ම ඔවුන්ගේ පෞරුෂත්වය තුළින් අප්‍රසන්න ප්‍රතිචාර දැක ගත හැකි වීම
2. යමක් ඉතා ඉක්මණින්, වේගවත්ව ආරම්භ කළ ද සන්සුන්වීමේ අපහසුව දැකගත හැකි වීම.
3. දරුවාගේ සාමාන්‍ය හැසිරීම් රටාවේ වෙනස්කම් දැකගත හැකි වීම. උදා:
   a) මහපොට ඇඟිල්ල ඉරීම, නින්දෙන් මුත්‍රා පිටවීම, අඳුරට ඇති බිය වැනි ලක්ෂණ දැකිය හැකි වීම.
   b) තනිව සිටීමට, මුළු ගැන්වීම හා ගුප්තබව දැකිය හැකි වීම.
   c) නිතරම අප්‍රසන්න දේ ගැන කථා කිරීමට උනන්දු වීම.
   d) ආහාර ගන්නා විටදී පවා විවිධ හැසිරීම් දැකිය හැකි වීම.

3.4. නොසලකා හැරීම

ළමයාට මූලික ශාරීරික හෝ මානසික අවශ්‍යතා ලබා නොදීම නිසා, එය ළමයාගේ සෞඛ්‍යයට හා සංවර්ධනයට බලපායි. එය නොසලකා හැරීම නම් වේ.

3.5. ළමයින් මෙහෙකාර සේවයේ යෙදවීම

කුඩා දරුවන් ඔවුන්ට ඔරොත්තු නොදෙන ඍකියාවන්වල යොදවමින් ළමා ශ්‍රමය සූරාකෑම ද දක්නට ලැබේ. මෙය ළමුන්ගේ අයිතීන් උල්ලංඝනය වන අනිසි තත්ත්වයක් ලෙස හැඳින්විය හැකිය. ලෝකයේ බොහෝ රටවල ළමුන් ශ්‍රමිකයන් ලෙස යොදවා ගැනීම වරදක් ලෙස නීතියෙන් අර්ථ දක්වා ඇත.

3.6. මීට අමතරව

1. ළමා වෙළදාම
2. සිතා මතා වස, විස හෝ මත්ද්‍රව්‍ය ලබාදීම
3. මැන්චවුසන් සින්ඩ්‍රෝම් බයිප්‍රොක්සි (Munchausen Syndrome by Proxy) ලෙස හඳුනාගන්නා අපයෝජනය. මෙහිදී භාරකරුවකුගේ පවතින සංකුලතාවයක් සන්සිඳවා ගැනීමට තම දරුවා තමා විසින්ම අපයෝජනයට ලක් කරයි.
4. ළමයින් සොල්දාදුවන් ලෙස යෙදවීම,
5. ළමයින්ට සිගාකෑමට සැලැස්වීම
6. ශරීරය වෙනස් කිරීම් හෝ ශරීර අවයව සිතා මතා ඉවත් කිරීම (Maiming)
7. ලිංගික අවයවයන් විකෘති කිරීම (Genital mutilations) යනාදියයි.

අපට දක්නට හෝ දැනගන්නට ලැබෙන්නේ සිද්ධීන්ගෙන් ඉතා සුළු කොටසකි. එය පාවෙන හිම ශිඛරයක පිටට පෙනෙන කොටස වැනිය (Ice - burgh phenomenon). එනම් අප දකින්නේ ප්‍රශ්නයේ හතෙන් එකක් (1/7) වැනි සුළු කොටසකි. බොහෝ සිද්ධි නිවසේ හෝ ආයතනවල බිත්ති හතර තුළ සැඟවී යයි. මෑතදී සිදුවීම් වැඩිවීමට හේතු වී ඇත්තේ පොලිසිය සහ වෙනත් අය දැනුවත් කිරීම සහ හඳුනා ගැනීම වැඩි වීම නිසයි.

සැබෑ ව්‍යාප්තිය තීරණය කිරීම සෑම රටකම අපහසුය. නමුත් වඩාත් සුලබ ළමා අපයෝජනය වන්නේ ''නොසලකා හැරීම''යි. එය එක්සත් රාජධානියේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ ද බහුලම හිංසනයයි. දෙවැන්න ශාරීරික හිංසනයයි.

## (4) ළමා අපයෝජන නිසා දරුවන් මුහුණපාන ගැටලු

ළමා අපයෝජනය දරුවන් කෙරෙහි විවිධ අහිතකර බලපෑම් ඇති කරයි. ඒවා පහත පරිදි සරලව දැක්විය හැකිය.

4.1. කායික ගැටලු

(1) තුවාලවීම හා ශාරීරික වද වේදනාව
(2) ආබාධිත/විකෘතිවීම
(3) අතුරු ආබාධ
(4) සමාජ රෝග
(5) ගැබ් ගැනීම ආදිය

4.2. මානසික ගැටලු

(1) අධික හිසරදය
(2) සාමාන්‍ය ප්‍රතිකාර වලින් සුව නොවන අසාමාන්‍ය බඩ රිදුම
(3) කෑම අරුචිය හා ආහාර අක්‍රමිකතා
(4) පෞරුෂමය දුර්වලතාවයන් හා තමා පිළිබඳ අවතක්සේරුව,
(5) ලිංගික කටයුතු ගැන අධික ආශාව/උනන්දුව (Hyper- sexuality)
(6) මානසික ආතතිය, කාංසාව, අවපීඩනය,
(7) බයිපෝල අක්‍රමිකතාව, පශ්චාත් ක්ලමත ආතති ආබාධය (Post Traumatic Stress Disorder), ආදිය

4.3. සමාජීය ගැටලු

(1) කොන් කිරීම
(2) අපහාසයට ලක්විම
(3) සමාජයට වෛර කිරීම
(4) දුම්පානය, මත්වතුර සහ මත්ද්‍රව්‍ය භාවිතය
(5) අනාරක්ෂිත ලිංගිකත්වය වැනි ඉහළ අවදානම් හැසිරීම් ආදිය

## (5) ළමා අපයෝජන සම්බන්ධයෙන් ක්‍රියා කරන ආයතන

ළමා අපයෝජන සම්බන්ධයෙන් ක්‍රියා කරන ආයතන ප්‍රධාන කාණ්ඩ 05 ක් යටතේ වර්ග කළ හැකිය.

5.1. පවුල් මට්ටම

මෙයට දෙමාපියන් හා භාරකරුවන් අයත් වේ. අපචාරයක් පිළිබඳ දැනගත් විට දෙමාපියන් හෝ භාරකරුවන් විසින් ඒ බව ඉහළ මට්ටමට දැනුම් දිය යුතුය. මෙහිදී වැදගත් වෙන්නේ සියළු දෙනාම ළමයින්ගේ උපරිම යහපත උදෙසා කටයුතු කිරීමයි. දරුවන්ගේ ආරක්ෂාව හා ගෞරවය සුරැකීමේ වගකීම මෙන්ම ප්‍රසිද්ධියට පත් නොකිරීමටත් කටයුතු කළ යුතුය. මේ සඳහා

1. 1929 ළමා ආරක්ෂක දුරකතන සේවයට ඇමතිය හැකියි - එය පැය24 පුරා ඇති භාෂා 3 න්ම නොමිලයේ ක්‍රියාත්මකවන සේවයකි. එයට පැමිණිලි කිරීම ළමයින් ඇතුළු ඕනෑම කෙනෙකුට කළ හැකි අතර එම පැමිණිලිකරුගේ පෞද්ගලිකත්වය හා රහස්‍යභාවය සැමවිටම ආරක්ෂා කිරීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය බැඳී සිටියි. (Annexure 01)

2. "1929 ළමා ආරක්ෂක යෙදුම" (1929 Child Protection App -Play store හෝ Apple store හරහා නොමිලයේ භාගත කරගත හැකි අතර එමගින් ලියවිල්ලක් ලෙස (Text message), හඬපටයක් (Audio clip) ලෙස හෝ වීඩියෝවක් (Video clip) ලෙස ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පැමිණිලි කළ හැකි ය. (Annexure 02)

3. තැපැල් අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර
4. ඊමේල් ලිපිනය - chairman.ncpa@gmail.com
   chairpersno@childprotection.gov.lk.
5. දුරකථන අංක - 0112 778 911- 14
6. ෆැක්ස් අංකය - 0112 778 767 ය.

5.2. ප්‍රජා මට්ටම
මේ යටතට,

1. ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන්
2. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින්
3. පරිවාස නිලධාරින්
4. සමාජ සේවා නිලධාරින්
5. සෞඛ්‍ය සේවා නිලධාරීන්
6. ග්‍රාම නිලධාරීන්
7. ප්‍රජා පාදක සංවිධාන අයත් වේ.

මෙහිදී මෙම නිලධාරීන් තමන්ගේ ඉහළ මට්ටමට දැනුම් දීම ද කළ යුතුය. ළමයින්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා වන ලෙස දෙමාපියන්ගේ හා භාරකරුවන්ගේ අනුදැනුම මත උපදේශනය හෝ වෙනත් සේවා සැපයීමද මෙහිදී සිදු වේ.

5.3. ප්‍රාදේශීය මට්ටම
මේ යටතට

1. ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන්,
2. ප්‍රාදේශීය ළමා මෙහෙයුම් කමිටු,
3. අධිකරණ වෛද්‍ය නිලධාරී,
4. පරිවාස නිළධාරීන්,
5. නොවිධිමත් අධ්‍යාපන නිලධාරී,
6. ප්‍රාදේශීය පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා මේසයේ නිලධාරීන්,
7. රාජ්‍ය නොවන සංවිධාන ආදිය අයත් වේ.

ඉහත මට්ටමට දැනුම් දී අදාළ නිලධාරින්ගේ උපදෙස් මත ළමුන්ගේ උපරිම යහපත වෙනුවෙන් කටයුතු කිරීම මෙහිදී සිදු වේ.

5.4. දිස්ත්‍රික් මට්ටම

මේ යටතට

1. දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන්,
2. දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරීන්,
3. දිස්ත්‍රික් ළමා අයිතිවාසිකම් කමිටුව,
4. විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරීන්,
5. පරිවාස කාර්යාලවල දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්,
6. කම්කරු නිලධාරීන්,
7. මානව හිමිකම් කොමිසම,
8. නීති ආධාර කොමිසම,
9. රාජ්‍ය නොවන සංවිධාන,
10. පොලිස් ස්ථානආදිය අයත් වේ.

මෙහිදී ළමා අපයෝජන වැළැක්වීමට පියවර ගැනීම සිදු වේ. තවද උපදෙස් සැපයීම, මග පෙන්වීම, වැඩිදුර පරීක්ෂණ මෙහෙයවීම හා ළමුන්ගේ උපරිම යහපත වෙනුවෙන් කටයුතු කිරීම ද සිදු වේ.

5.5. ජාතික මට්ටම

මේ යටතට

1. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය - 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත යටතේ ළමා ආරක්ෂක අධිකාරිය ව්‍යවස්ථානුකූලව ස්ථාපනය කොට තිබේ. තවද අදාළ ළමා අපයෝජන පිළිබඳව පැමිණිලි ඉදිරිපත් කිරීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 1929 කෙටි දුරකථන අංකය හඳුන්වා දී තිබේ. ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2019 දී අනුමත විය. ඒ සඳහා පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්මක් (2021 - 2025) පාර්ශවකරුවන් වන දෙපාර්තමේන්තු 12 ක් සමග සාකච්ඡා කොට සාදනු ලැබේ.
2. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව.
3. පොලිස් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කොට්ඨාශය.
4. ශ්‍රී ලංකාවේ විශේෂඥ අධිකරණ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය.
5. ළමා රෝග විශේෂඥයින්ගේ විද්‍යායතනය.
6. මානසික රෝග විශේෂඥයින්ගේ විද්‍යායතනය.
7. ළමා හා යෞවන මානසික රෝග විශේෂඥයින්ගේ විද්‍යායතනය.
8. පවුල් සෞඛ්‍යය කාර්යාංශය.
9. පළාත් අධ්‍යාපන කාර්යාලය.
10. කම්කරු දෙපාර්තමේන්තුව.
11. මානව හිමිකම් කොමිසම.
12. සාක්ෂිකරුවන් හා වින්දිතයින් ආරක්ෂා කිරීමේ අධිකාරිය ආදිය මේ යටතට ගැනේ.

5.6. අන්තර්ජාතික මට්ටම

මේ යටතට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය 1989 දී ඉදිරිපත් කළ අතර 1991 දී ලංකාව එයට අත්සන් තබන ලදී. UNICEF වැනි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විවිධ අන්තර් රාජ්‍ය ශාඛා ද ඇත.

## (6) ළමා අපයෝජන හඳුනා ගැනීම

මෙහිදී වැදගත්ම දෙය ළමා අපයෝජනය පිළිබඳ සැකයක් ඇතිවීමයි.

6.1. ඉතිහාසයෙන් ලබා ගතහැකි තොරතුරු

1. වෛද්‍ය කටයුතු සඳහා ප්‍රමාද වී රැගෙන ඒම
2. සායනික ඉතිහාසය හා තුවාල නොගැලපීම
3. වරින් වර සිද්ධි ඉතිහාසය වෙනස් කිරීම
4. ඉතිහාසය වයසට අදාළ වර්ධනයට නොගැලපීම
5. අපයෝජන වර්ග හා අවස්ථා බොහෝ වීම

6.2. රෝග ලක්ෂණ මගින් ලබා ගතහැකි තොරතරු

1. ශරීරයේ විවිධ තුවාල වර්ග තිබීම
2. යෝනි මාර්ගයෙන් ශ්‍රාවයක් ගැලීම
3. විශේෂයෙන් ලේ හා සැරව ගැලීම
4. ලිංගාශ්‍රිත සමේ රෝග ඇතිවීම
5. මළපහ කිරීමේදී වේදනාව ඇතිවීම
6. සමහරවිට ගුදමාර්ගයෙන් ලේ වහනය වීම
7. අසාමාන්‍ය හිසේ කැක්කුම, බඩ රිදුම
8. ව්‍යාජ අපස්මාරය ආදිය

6.3. හැසිරීමෙන් හා මානසික සෞඛ්‍යයෙන් ලබා ගතහැකි තොරතුරු

1. පාසලේ කුසලතාවයන් අඩුවීම හෝ පාසල් යාමට අකමැතිවීම
2. එදිනෙදා ඇතිවන හැසිරීමේ වෙනස්කම්
3. තමා විසින් කරගන්නා තුවාල හෝ සියදිවි නසා ගැනීමට තැත් කිරීම
4. අපයෝජකයාට බිය බවක් දැක්වීම
5. අනිත් දරුවන්ට සහ වැඩිහිටියන්ට වෛර කිරීම ආදිය

6.4. ලිංගිකතාවයට අදාළ වූ අසාමාන්‍ය හැසිරීම

1. සමහර පුද්ගලයින් හෝ ස්ථාන මගහැරීම
2. සමහර පුද්ගලයින් සමග අසාමාන්‍ය ලෙස මිතුරුවීම ආදිය

6.5. සමාජයීය තොරතුරු මගින් ලබා ගතහැකි කරුණු

1) අනාරක්ෂිත පවුල්/ළමයින්

1. මව/පියා වෙන්ව ජීවත් වන හෝ දික්කසාද වූ දෙමව්පියන්
2. මව/පියා ජීවතුන් අතර නැත
3. මව/පියා සිරගතව ඇත
4. මව/පියා මත්ද්‍රව්‍ය භාවිතා කරයි
5. මව/පියා දුර හෝ විදේශ රැකියාවක යෙදීම

ළමයා පියාගේ දෙවන විවාහය/මවගේ දෙවන විවාහය සමගින් ජීවත් වේ

7. පවුලේ ආර්ථික දුෂ්කරතා
8. ළමයාගේ භාරකරු ලිංගික ශ්‍රමිකයෙකි
9. ළමයා භාරකරුගෙන් වෙන්ව තනිව ජීවත් වේ
10. භාරකරුවන් මානසික රෝගයකින් පෙළෙයි
11. අපයෝජනය කළ පුද්ගලයා ඒම නිවසේම වාසය කරයි
12. ළමයා පාසල් කාලයෙන් පසුව රාත්‍රිය වනතුරු තනිව ජීවත් වේ
13. ළමයා නිවසේ මෙහෙකරුවන් සමග රාත්‍රිය වනතුරු ජීවත් වේ
14. ළමයාට වෙන් වූ ජංගම දුරකථනයක් ඇත
15. ළමයාට අන්තර්ජාල පහසුකම් ඇත
16. ළමයාගේ නිවසේ කේවල උපකාරක පංති පැවැත් වේ
17. විශේෂ අවශ්‍යතා සහිත ළමයෙකි
18. වීදි ළමයින්, පැල්පත් ළමයින්, වෙරළ ආශ්‍රිත ළමයින් ආදිය

2) අවදානම් ළමයින්

1. ළමයා මත්ද්‍රව්‍ය භාවිතා කරයි
2. විශේෂ අවශ්‍යතා සහිත ළමයෙකි
3. ළමයා හීන ආත්ම අභිමානයකින් ජීවත් වේ
4. ළමයා හීන පෞරුෂයකින් යුක්ත වේ
5. HIV/ සමාජ රෝග සෑදිය හැකියි
6. ගැබ් ගත හැකියි

3) ආන්තික ළමයින්

1. මුදල් හිගකම නිසා අධ්‍යාපනය, සෞඛ්‍ය, ඇඳුම්, ආහාර ගැටලු පවතී
2. සමාජ කොට්ඨාශයක් වශයෙන් ජීවත්වීම නිසා ගැටලු ඇති වීතිබේ
3. ජාතිය/ආගම හේතුකොටගෙන ළමයාට ගැටලු ඇති වී තිබේ
4. භාරකරුවන් දේශපාලනික වශයෙන් පළිගැනීම්වලට ලක්ව ඇත
5. ළමා නිවාස ගත විය හැකියි

4) ඇස නොගටෙන ළමයින්

1. ළමා ශ්‍රමිකයින් විය හැකියි
2. ළමා ලිංගික ශ්‍රමිකයෙකි
3. මත්ද්‍රව්‍ය ජාවාරම්කරණයට හසු වී ඇත
4. අඩු වයස් වෛවාහික සබඳතා පවත්වයි

5) ළමා ආරක්ෂණය පිළිබඳ අවසන් තක්සේරුව

1. ළමයා අනාරක්ෂිතය (ඉහත දැක්වූ අනු සාධක 04 න් 01 ක් පැවතීම)
2. ළමයා අධි අනාරක්ෂිතය (ඉහත දැක්වූ අනු සාධක 04 න් 02 ක් හෝ ඊට වැඩි ගණනක් පැවතීම)

6.6. සායනික පරික්ෂාවේදී ලබාගත හැකි තොරතුරු

1. නොසැලිකිලිමත්බව දක්නට ලැබීම
2. විවිධ වයස්වල හා විවිධ වර්ගයේ තුවාල තිබීම
3. අසාමාන්‍ය භග්න තිබීම. උදා - වයස අවුරුදු 01 ට අඩු ළමුන්ගේ දිගු අස්ථිවල භග්න තිබීම (විශේෂයෙන් සිග්මාකාර)
4. කැපුම් තුවාල තිබීම
5. පිළිස්සුනු තුවාල (ගිනි පෙනෙලි, දුම්වැටි හෝ රත්වූ යකඩ කුරුවලින් පිළිස්සීම, උණුකිරි පෙවීම ආදිය)
6. ශේකන් බෙබි සින්ඩ්‍රෝම් (Shaken Baby Syndrome) උදා - පපුවේ ඇගිලි තුඩුවලින් සිදුවූ තැලුම් තුවාල හා ඇස්වලට ලේ ගැලීම
7. යෝනි මාර්ගයේ ආගන්තුක ද්‍රව්‍ය තිබීම
8. ලිංගාශ්‍රිත තුවාල (උදා- සීරීම්, තැලුම්, ඉරීම්ආදිය)
9. අධෝ මාර්ගයේ අසාමන්‍ය ඉරුම් තුවාල
10. උඩුතොලෙහි ඇතුල් පැත්තේ මධ්‍යස්ථයේ ඇති පටකය (Frenulum) ඉරීම
11. මුඛ කුහරයේ තුවාල තිබීම ආදිය

6.7.මානසික ඇගයීමෙන් ලබාගත හැකි තොරතුරු

1. මානසික අවපාතයක් තිබීම
2. ළමයා ඇසට - ඇස නොගැටසෙන සේ වෙනත් අතක බලාකථාකිරීම
3. අසාමාන්‍ය ලෙස තරහායාම
4. භාරකරුවන් සමග අසාමාන්‍ය ඇසුරක් තිබීම
5. මීට අතරව අනෙකුත් මානසික හා ශාරීරික සැක සහිත තොරතුරුද සැලකිල්ලට ගත හැකිය.

6.8. ළමයා විසින් ලබාදෙන ඉතිහාසය මත

1. තමාට අපයෝජනයක් සිදු කළ බව ළමයා පැවසීම
2. ළමයින් බොරු කියයිද? ඔව්, කාලතුරකින් ළමයින් විසින් බොරු කිව හැක. එම නිසාම, මේ අවස්ථාවේ ‘‘ඔව් හෝ නැහැ’’ යන පිළිතුරු ලැබෙන ප්‍රශ්න නොඇසිය යුතුය.

## (7) ළමා අපයෝජන කළමනාකරණය

කාන්තා හා ළමා හිංසනය කළමනාකරණය සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාව සිදුකලේ රෝහල් බද්ධවයි. නමුත් එය අද සිදු කරනු ලබන්නේ රෝහල හා සමාජය යන දෙකම අනුබද්ධිතව යි. මෙහි අරමුණ වන්නේ ළමයාට ආරක්ෂාකාරී, විශ්වාසවන්ත, තමාට නිදහසේ අදහස් ප්‍රකාශ කළ හැකි, ඔවුන්ට ඇහුම්කන් දෙන, ඔවුන්ව පිළිගන්නා හා ළමයාට ගෞරව කරන ස්ථානයක් නිර්මාණය කිරීමයි.

7.1. බහු ආංශික කළමනාකරණය - ළමා අපයෝජන කළමනාකරණය අත්‍යවශ්‍යයෙන්ම බහු ආංශික කළමනාකරණයක් විය යුතුය

(A) වෛද්‍ය කළමනාකරුවන්

1. රෝහල් පාලක වෛද්‍යවරුන්
2. විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා
3. ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයා
4. මානසික රෝග විශේෂඥ වෛද්‍යවරයා

ඊට අමතරව

5. මනෝ උපදේශක,
6. සමාජ රෝග පිළිබඳ වෛද්‍යවරයා, විශේෂඥ කාන්තා රෝග පිළිබඳ වෛද්‍යවරයා, විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයා,
7. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය ආදිය

(B) සමාජමය කළමනාකරුවන්

1. දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරින්
2. දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරින්
3. ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරින්
4. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි
5. පරිවාස නිලධාරින්
6. පාසල්වල නියෝජිතයින්
7. උපදේශන නිලධාරීන්
8. ඊට අමතරව ග්‍රාමසේවා නිලධාරින් ද අයිතිය

(C) නෛතික කළමනාකරුවන්

1. ළමයා ජීවත්වන ප්‍රදේශයේ පොලිස් නිලධාරින්
2. කම්කරු දෙපාර්තමේන්තු නිලධාරීන්
3. නීති ආධාර කොමිසමේ නිලධාරීන්
4. රජයේ නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයින් ආදිය

7.2. ළමයා රෝහල්ගත කිරීම තීරණය කරන අයුරු

මෙහිදී

1. කායික, මානසික, හෝ ශෛල්‍ය ප්‍රතිකාර ආදිය බාහිර රෝගියකු ලෙස ලබා දීමට නොහැකිනම්,

2. ළමයාගේ භාරය හා ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් තිබේනම්, උදා - අපයෝජකයා අපයෝජනය සිදු කළ ස්ථානයේ හෝ ඒ අවට සිටීනම් හෝ අපයෝජකයා භාරකරුවෙක් නම් අදාළ වාට්ටුවට ඇතුළත් කළ යුතුය. ළමා පියස වාට්ටුවක් තිබේනම් ළමයා එයට ඇතුළත් කළ යුතුය.

කුමන වාට්ටුවට ඇතුළත් කරන්නේදැයි තිරණය කළ නොහැකිනම්, ආයතන ප්‍රධානියාගේ අනුමැතිය අනුව ළමා රෝග, මානසික රෝග, ශෛල්‍ය රෝග, කාන්තා රෝග ආදී වාට්ටුවකට ඇතුළත් කළ හැකිය.

දෙමව්පියන් හෝ භාරකරුවන් ළමයා රෝහලට ඇතුළත් කිරීම ප්‍රතික්ෂේප කරන්නේනම් බාහිර රෝගී අංශයේ වෛද්‍යවරයා කළ යුත්තේ අධිකරණ වෛද්‍යවරයා මගින් උසාවි නියෝගයක් ලබාගෙන ළමයා රෝහලට ඇතුළත් කිරීමට කටයුතු කිරීමයි.

1) සායනික සිද්ධි සමාලෝචනයේ අරමුණු හා පියවර

නැවත - නැවත - වින්දිතභාවය (Re -victimization) ට පත්වීම වැළැක්වීමට රෝහලට ඇතුළත් වී පැය 24 ක් ඇතුළත "සායනික සිද්ධි සමාලෝචනය" (Clinical case conference) පවත්වනු ලබයි. ළමයා රෝහලට පළමුව ඇතුළත් වන ස්ථානය අනුව, අධිකරණ වෛද්‍යවරයා, ළමා රෝග වෛද්‍යවරයා, කාන්තා රෝග වෛද්‍යවරයා හෝ මානසික රෝග වෛද්‍යවරයා අදාල මුල් ඉතිහාසය ලබා දෙන්නා වන අතර එය අනෙක් විශේෂඥ වෛද්‍යවරුන් අතරේ හුවමාරු කර ගැනීමෙන් නැවත නැවත එකම ඉතිහසය ළමයාගෙන් ඇසීම අවම කරගත හැකිය. මේ නිසා අදාළ වෛද්‍යවරයා ලබා ගන්නේ තමාට අදාළ ඉතිහාසය පමණකි.

2) ආයතනික සිද්ධි සමාලෝචනයේ අරමුණු හා පියවර

ද්විතීක -අපයෝජනය (Secondary Victimization) වැළැක්වීම සඳහා "ආයතනික සිද්ධි සමාලෝචන වැඩසටහනක්" (Institutional case conference) පවත්වා ළමයා සුදුසු භාරකාරත්වයකට පත්කළ යුතුයි. ඒ අනුව ළමයා තබන ස්ථානය පිළිබඳ පහත තීරණ තුනෙන් එකක් ගත හැකියි.

1. නැවත නිවසට යොමු කළ හැකියි

a) ළමා ආරක්ෂක නිලධාරියා "ළමා ආරක්ෂක ඇගයීම් වාර්තාව" (Child protection assessment report) ඉදිරිපත් කළ යුතුයි. (Annexure 03)
b) පරිවාස නිලධාරියා සමාජ වාර්තාව (Social report) ඉදිරිපත් කළ යුතුයි.
c) ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරියා වාර්තාව ඉදිරිපත් කළ යුතුයි
d) ඒවා මත තීරණය කළ කාලයක් සඳහා ළමයා හා පවුල පරිවාස නිලධාරියාගේ අධීක්ෂණය යටතේ තබනු ලැබේ.
e) අවශ්‍ය වූ විට ග්‍රාම නිලධාරි හෝ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරියා සම්බන්ධ කළ හැකිය.
f) රෝහල තුළ පසු විපරම කළ යුත්තේ ළමා රෝග විශේෂඥවරයා හා මානසික රෝග විශේෂඥ වෛද්‍යවරයා විසිනි.

2. නැවත නිවසට යොමු කිරීමට නොහැකි නම්

a) පවුලේම වෙනත් සාමාජිකයෙකුට හෝ විශ්වාසවන්ත නෑදෑයකුට (**Fit person**) භාරදීමට උත්සාහ කළ යුතුය. පරිවාස නිලධාරියා එම ළමයාට රැකවරණය දීමට හැකියාව ඇති පවුලේ සාමාජිකයා පිළිබඳ සමාජ වාර්තාව සිද්ධි සමාලෝචන කමිටුවට වාර්තා කළ යුතුය.

b) ඔහු සුදුසු පුද්ගලයෙක් නම් (Fit person) භාරකාරත්වය ලබාදීම සඳහා අධිකරණයට දැන්විය යුතුය.

3. රැකවරණය සඳහා කිසිවෙකු නොමැතිනම්

a) පරිවාසයට අයත් සුදුසු ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් තීරණය කළ යුතුය.
b) වෙනත් කිසිදු පියවරක් ගැනීමට නොහැකි අවස්ථාවක අවසන් විකල්පය ලෙස නිවාසගත කිරීම සැළකිය යුතු වේ.
c) ආයතනික සිද්ධි සමාලෝචන ෆෝරමය පිරවීමෙන් පසු සහභාගි වූ නිලධාරින් විසින් එය අත්සන් කොට එහි මුල් පිටපත පරිවාස නිලධාරියා විසින් ප්‍රදේශයේ මහේස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කළ යුතුය.
d) මහේස්ත්‍රාත්වරයාගේ තීරණය පරිවාස නිලධාරියා විසින් රෝහල් අනුබද්ධ පසු විපරමට දැන්විය යුතුය.
e) ඉහත සියලූම අවස්ථාවන්හි දී පරිවාස නිලධාරින් විසින් තීරණය කරන ලද කාලයක් තුළ පසු විපරම් සිදු කොට පශ්චාත් සමාජ වාර්තා (Post - social report) ඉදිරිපත් කළ යුතුය.
f) ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයා හා මානසික රෝග විශේෂඥ වෛද්‍යවරයා රෝහල් අනුබද්ධ පසු විපරම (Follow up) කළ යුතුය.
g) සමාජ අනුබද්ධ කළමණාකරණය සති 02 කට වරක් ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයා, මානසික රෝග විශේෂඥ වෛද්‍යවරයා හා පරිවාස නිලධාරි විසින් පසු විපරමට ලක්කළ යුතුය.
h) වැරදිකරුවකු සෙවීම ආයතනික සිද්ධි සමාලෝචන වැඩ සටහනේ අරමුණක් නොවේ. පොලිස් පරීක්ෂණ කටයුතු සිදුකළ යුත්තේ පොලිස් නිලධාරියා විසිනි.
i) විශ්වාසවන්ත ඥාතියකු හෝ පරිවාස ගත වන ළමයින්, වාර්ෂිකව, ළමා ආරක්ෂක නිලධාරීන් විසින් නියාමනය (NCPA Annual Fit - person's Monitoring) කරනු ලැබේ. එහි වාර්තාව දිස්ත්‍රික් හෝ පළාත් පරිවාසය කොමසාරිස්ට ලබාදෙනු ලැබේ.

7.3. දිස්ත්‍රික්/ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරියාගේ හා දිස්ත්‍රික් මනෝ සමාජීය නිලධාරියාගේ වගකීම

(1) දැනුවත් කිරීම හා ඒ තුළින් ළමා අපයෝජන වැළැක්වීම සඳහා

1) ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්තු හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම අයත්වන ප්‍රදේශවල සිටින ළමයින් සඳහා ක්‍රියාකරන ආයතන හා සේවාවන් වලදී

1.ළමයින් සඳහාම ඒවා නිර්මාණය කිරීමටත්,
2.ඒවායෙහි දී ළමා සහභාගිත්වය තහවුරු කිරීමටත්,
3.එහිදී ළමා ආරක්ෂණය සහතික කිරීමටත් ක්‍රියා කරයි.

2) ගම් මට්ටමින් ප්‍රජාව, දෙමාපියන්, හා ළමයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
3) "ළමයා හා නීතිය" පිළිබඳ පුවත්පත්, ගුවන්විදුලි හා රූපවාහිනී වැඩසටහන් සිදු කිරීම හා විෂය මාලාවට "ළමයා හා නීතිය" මොඩියුලයක් හඳුන්වාදීමට ජාතික අධ්‍යාපන ආයතනය හා අධ්‍යාපන අමාත්‍යංශය සමග සාකච්ඡා කොට ළමයා හා නීතිය පිළිබඳ වෙනම මොඩියුලයක් 6 වන ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වාවූ විෂය මාලාවට හඳුන්වාදීමට සාකච්ඡා පවත්වමින් සිටී.
4) ශික්ෂාකාමී දරු පරපුරක් නිර්මාණය කිරීම උදෙසා ගුරුවරුන් හා දෙමව්පියන් පාදක කරගත් "ධනාත්මක ශික්ෂණය පිළිබඳ අත්පොත" පාදකකොට වැඩසටහන් පැවැත්වීම
5) පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන කිරීම
6) විද්‍යාපීඨ හා සෞඛ්‍ය කාර්යමණ්ඩල දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන කිරීම
7) පාසල් ළමා ආරක්ෂක කමිටු දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන කිරීම. පාසල් තුළ ළමා ආරක්ෂක පුවරු ස්ථාපිත කිරීම අධ්‍යාපන අමාත්‍යංශය සමග සාකච්ඡා කොට ආරම්භ කරන ලදී
8) ළමා සංවර්ධන මධ්‍යස්ථාන දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන
9) වතු ප්‍රජාව දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන
10) රජයේ භාර ගැනීමේ නිවාස (Receiving homes) කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන
11) දිවා සුරැකුම් මධ්‍යස්ථාන දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන
12) සෞඛ්‍ය වෘත්තිකයින් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන්
13) ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් දැනුවත් කිරීම

14) ජාතික ළමාආරක්ෂක අධිකාරියේ ඒකක 2 ක් මේ සඳහා කටයුතු කරයි. ඒ
1.සැලසුම් සහ තොරතුරු ඒකකයත්,
2.වැඩසටහන් ඒකකයත්ය

(2) ළමා ආරක්ෂණය තහවුරු කිරීම සඳහා

1) අධිකාරියට ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් අවශය අවස්ථාවල දී කරුණු අණාවරණය කර ගැනීම හා සනාථකර ගැනීම හදහා මූලික විමර්ශනයක් පැවැත්වීම මෙන්ම සාම නිලධාරියෙකු ලෙස අවශ්‍ය අවස්ථාවල දී බලය පැවරීම තුලින් විශේෂ විමර්ශන සිදු කිරීම.

2) ජාතික ළමා ආරක්ෂක අධිකාරියට 1929 හෝ වෙනත් ක්‍රම මගින් ලැබෙන පැමිණිලිවල තොරතුරු ප්‍රමාණවත් නොවූ විට එම තොරතුරු ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරියාට යොමුකරන අතර පැමිණිල්ල/තොරතුර පිළිබඳ ළමා ආරක්ෂක නිලධාරියාගේ විමර්ශන නිර්දේශය "ළමා ආරක්ෂක නිලධාරියාගේ විමර්ශන වාර්තාව" (Child abuse investigation report) මගින් නීති බලාත්මක කිරීමේ ඒකකයට යොමු කරනු ලැබේ. (Annexure 04)

3) ප්‍රාදේශීය පොලිස් ස්ථාන වෙත වාර්තාවන ළමා අපයෝජන පිළිබඳ "ප්‍රථම වාර්තා" (First report) පැය 24 ක් ඇතුළත ජාතික ළමා ආරක්ෂක අධිකාරියට දන්වන අතර, එම වින්දිත දරුවන් සියලූ දෙනාහට මනෝ සමාජීය සහය සේවය ලබා දෙනු ලැබේ. එම ප්‍රථම වාර්තා "පොලිස් පැමිණිලි යාවත්කාලීන හා නියාමනය කිරීමේ පද්ධතියක්" (Police Complaint update monitoring system - Police CUMS) හරහා නියාමනය කෙරේ.

4) නීතිපති දෙපාර්තමේන්තුවේ කහ කොලය (Yellow sheet) හරහා ලැබෙන මහාධිකරණ අධිචෝදනා ගොනු කිරීම, මහේස්ත්‍රාත් උසාවියට යොමු කිරීම හෝ වරදින් සැකකරු නිදහස් කිරීම පිළිබඳ තොරතුරු නියාමනය කෙරේ.

5) සුනාමි වින්දිත ළමුන් සඳහා අධ්‍යාපන ආධාර ලබාදීම සිදු කරයි.

(3) දිස්ත්‍රික් මනෝ සමාජීය නිලධාරියාගේ වගකීම්

1) "සිත්- සවිය" ජාතික ළමා කේන්ද්‍රිය මනෝ - සමාජයීය සහාය සේවය (National child – centred – psycho -social support –service NCPS) වින්දිත ළමයින්ට ලබා දීම. සියලුම මනෝ උපදේශකයින් එක වහලක් යටතට ගැනීමට මෙම ජාතික වැඩසටහනට හැකිව ඇත. මෙය සෑම දිස්ත්‍රික්කයකම කාන්තා කාර්යාංශයේ, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ, රෝහල්වල මිතුරු පියස හා මනෝ චිකිත්සක ඒකකවල සිටින මනෝ උපදේශකයින් සියලු දෙනාගේ තොරතුරු සහිත ජාතික වැඩ සටහනකි (Annexure 05).

2) විවිධ තත්වයන් හා ආයතනවල සිදුවූ ළමා අපයෝජනවල දී අපගේ ළමා ආරක්ෂක හා මනෝ සමාජීය නිලධාරීන් විසින් සිදු කරනු ලැබූ සාර්ථක මෙහෙයුම් පිළිබඳ සිද්ධි අධ්‍යයන ඇතුළත් දැනුවත් කිරීමේ මෙවලම් සකස් කර යොදා ගැනීම. මනෝ සමාජයීය සිද්ධි අධ්‍යයන "සාර පැස" ලෙසද අනෙකුත් අපයෝජන පිළිබඳ සිද්ධි අධ්‍යයන, ළමයා හා නීතිය, ලෙසද යොදා ගැනෙයි. (Annexure 06)

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ඒකක 05 ක් මේ සඳහා කටයුතු කරයි. එනම්

1. නීතිය බලාත්මක කිරීමේ ඒකකය

a) දිස්ත්‍රික් (50) හා ප්‍රාදේශීය ක්ෂේත්‍ර නිලධාරීන් (360) = 410
b) විමර්ශන ඒකකය
c) 1929 ළමා ආරක්ෂක දුරකථන සේවය
d) සයිබර් ආවේක්ෂණ ඒකකය (Cyber surveillance unit) - මෙය විමර්ශන ඒකකයක් (Cyber investigation Unit) ලෙස පැවති අතර, 2020 මාර්තු මාසයේ, එය ආවේක්ෂණ ඒකකයක් බවට පත් කරන ලදී.
e) වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය (Video Evidence recording unit) - 1999 අංක 32 දරන සාක්ෂි විශේෂ විධිවිධාන පනත ප්‍රකාරව ළමයා ද්විතික වින්දිතභාවයට පත් කිරීම (Secondary Victimization) වැළැක්වීමට වීඩියෝ සාක්ෂි පටිගත කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් සිදු කරනු ලබයි. දැනට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ පමණක් එක් වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකයක් ක්‍රියාත්මකවේ. තවදුරටත් මෙම කාර්යය වඩාත් කාර්යක්ෂමව සිදුකිරීම සඳහා වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක 09 ක් පළාත් 09 හි පිහිටුවීම සඳහා වන කැබිනට් පත්‍රිකාව අමාත්‍යංශය වෙත භාර දී ඇත.

f) මධයම ලේඛණාගාරය - සියලු පැමිණිලි ලේඛන ගත කිරීම හා බෙදා හැරීම

2. විශේෂ පොලිස් විමර්ශන ඒකකය

a) 1929 ළමා ආරක්ෂක දුරකථන සේවය හරහා හෝ අනෙක් ක්‍රම වලින් යොමුවන පැමිණිලි අදාළ පොලිසියට යොමු කිරීම හා ඒවා නියාමනය කර වාර්තා කිරීම.
b) සමහර අවස්ථාවලදී, ප්‍රාදේශීය පොලිස් පරීක්ෂණ පිළිබඳ සෑහීමකට පත් නොවන විට, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පොලිස් ඒකකය හරහා පරීක්ෂණ පවත්වා සැකකරුවන් අත් අඩංගුවට ගෙන අධිකරණවල නඩු ගොනු කරයි.
c) විශේෂ පොලිස් විමර්ශන ඒකකයේ නිළධාරීන් ළමා අපයෝජන සම්බන්ධව අධිකරණ කටයුතු සඳහා පෙනී සිටීම සිදු කරයි

3. මාධ්‍ය ඒකකය

a) මාධ්‍ය විමර්ශන ඒකකය (Media investigation unit) - හරහා වින්දිත ළමයා හඳුනා ගැනීමට හැකි වන පරිදි ප්‍රකාශනය හඳුනා ගෙන ඒවාට විරුද්ධව නඩු පැවරීම සඳහා නීතිය බලාත්මක කිරීමේ අංශයට යොමු කරනු ලැබේ. මෙය ජාතික ළමා ආරක්ෂක අධිකාරියට හඳුන්වා දෙන ලද්දේ 2020 මාර්තු මාසයේදීය. දෛනික පුවත්පත් වාර්තා ඇසුරින් ළමා අපයෝජන වාර්තාකරණය නියාමනය කරයි. එහිදී ලංකාදීප, මව්බිම, දිනමිණ, අද, දිවයින, අරුණ, සිළුමිණ, ලක්බිම, වීරකේසරී, ඉරිදා ලංකාදීප, ඉරිදා දිවයින, සතිඅග අරුණ, ඉරිදා මව්බිම. ඉරිදා රිවිර, ඉරිදා දේශය, Sunday Times, Sunday Observer, Sunday Weerakesari, Thinakaran, සහ Ceylon Today, යන පුවත්පත් ඇසුරින් මෙම නියාමනය සිදු කරයි. මාධ්‍ය විමර්ශන ඒකකය හරහා වින්දිත ළමයා හඳුනා ගැනීමට හැකිවන පරිදි ප්‍රකාශනය හඳුනා ගෙන ඒවා නිවැරදි කිරීම හෝ නඩු පැවරීම කරනු ලබයි.

b) ළමා ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීම උදෙසා වාර්තා වැඩසටහන් සහ කෙටි වීඩියෝ පට නිශ්පාදනය. මෙය ජාතික ළමා ආරක්ෂක අධිකාරියට හඳුන්වා දෙන ලද්දේ 2020 මාර්තු මාසයේදීය. මේවා ළමා ආරක්ෂක අධිකාරියේ මානව සම්පත් හා තාක්ෂණය යොදා ගෙන සිදුකරන අතර ඒ සඳහා වැය වනුයේ අවම මුදලකි.

c) ළමා ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීම උදෙසා පෝස්ටර් සහ 1929 ළමා උපකාරක දුරකථන සේවය ප්‍රවර්ධනය සඳහා මෙවලම් මුද්‍රණය කරයි

d) ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සඳහා නව නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම

e) ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සඳහා නව නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම හා පවත්වාගෙන යයි.

4. නීති ඒකකය

a) ළමා ශ්‍රමිකයින් පිළිබඳ තොරතුරු ලැබුණු විට ඒවා කම්කරු දෙපාර්තමේන්තුවට යොමු කරනු ලබයි.

b) ළමයින්ගේ රැකවරණය සහ ආරක්ෂාව පිළිබඳ ගැටලු නිරාකරණය කරයි.

c) නීතිමය උපදෙස් දීම හා උසාවිවල ළමා නඩුවලට පෙනී සිටීම සිදු කරයි

5. මනෝ - සමාජීය ඒකකය

a) සිත් - සවිය, ජාතික ළමා කේන්ද්‍රිය මනෝ- සමාජයීය සහාය සේවය (National child – centred – psycho -social support –service NCPS) වින්දිත ළමයින්ට ලබා දීම.

b) 1929 පැමිණිලි සඳහා - මනෝ සමාජීය මැදිහත්කරණයන් ලබා දීම.

c) මනෝ සමාජයීය ඒකකයට කෙලින්ම පැමිණෙන පැමිණිලි - සඳහා මැදිහත්කරණයන් / උපදෙස් ලබාදීම

d) ප්‍රථම වාර්තා (First report) ලෙස පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ වලින් යොමු කරන ලද ළමා අපයෝජන සිදුවීම් වලට - අදාළ මනෝ සමාජයීය මැදිහත්කරණයන් සිදු කිරීම

e) දිරිය වැඩසටහන - සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්ම ළමයින් 10 දෙනෙකු බැගින් තෝරා මනෝ සාමාජීය සහය හා අධ්‍යාපන ආධාර ලබා දීම සිදු කරයි.

(5) වින්දිත ළමයකු රෝහලට ඇතුළත් කළහොත්

1) නැවත නැවත හිංසනය (Re -Victimization) සිදු විය හැකියි. එනම් රෝහල් පද්ධතිය තුළදී විවිධ පාර්ශව කරුවන් අපයෝජන සිද්ධිය පිළිබඳ ඉතිහාසය නැවත නැවත ලබා ගැනීමයි. එය වැළැක්වීම සඳහා

1. සායනික සිද්ධි සම්මන්ත්‍රණයක් (Clinical Case Conference/CCC) පැවැත්වීම.
2. ළමා රෝග අංශයේ ළමා පියසට ඇතුළු කිරීම
3. වීඩියෝ සාක්ෂි පටිගත කිරීම

2) ද්විතීයික හිංසනය (Secondary victimization) වැළැක්වීම සඳහා ආයතනික සිද්ධි සම්මන්ත්‍රණයක් (ICC) ක් පවත්වා විශ්වාසදායක භාරකාරත්වයකට භාර දීම

1. පරිවාස නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ නැවත එම දෙමාපියන්ටම භාරදීම
2. අපයෝජකයා භාරකරුවෙකු නම්, වෙනත් විශ්වාසදායක ඥාතියෙකුට (Fit person) භාරදීම. එහිදී පාසල් අධ්‍යාපනය සහතික කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ODK අධීක්ෂණය 2020 සිට සිදු කරනු ලබයි.

3. එවැනි ඥාතියෙකුවත් නොමැති විට, විකල්පරුකවරණ ක්‍රමවන ළමා සංවර්ධන මධ්‍යස්තානයකට (ළමා නිවාසයකට) යොමු කළ හැකියි.

a) එහිදී ළමා ආරක්ෂක ඇගයීම් වාර්තාව (Child protection Assessment report) ආයතනික සිද්ධි සමාලෝචන වැඩසටහනට ලබා දීම (Annexure 03)
b) එම ළමයින් සඳහාද ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික ODK අධීක්ෂණය 2020 වර්ෂයේ සිට කරනු ලබයි.

4. ආයතනික සිද්ධි සමාලෝචන වැඩසටහනහි ක්‍රියා පටිපාටිය නියාමනය කිරීම. ඒ සඳහා "සිද්ධි සම්මන්ත්‍රණ ඇගයීම් වාර්තාව" (Case conference evaluation report) නීති බලාත්මක කිරීමේ ඒකකයට යොමු කළ යුතුය. (Annexure 07)

# (6) වින්දිත ළමයකු පොලිසියට ගියහොත්

අපරාධ යුක්ති විනිශ්චය ක්‍රියාපටිපාටිය ළමා හිතකාමී විය යුතුය

1) වීඩියෝ සාක්ෂි පටිගත කිරීම - සාක්ෂි ආරක්ෂා කිරීමට සහ නැවත ගොදුරු වීම වැළැක්වීමට සිදු කරනු ලබයි.
2) ප්‍රාදේශීය පොලිසිය ගැන සෑහීමකට පත් නොවන්නේ නම් - ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පොලිස් ඒකකය විසින් විමර්ශනය සිදු කරනු ලබයි
3) ප්‍රාදේශීය පොලිස් ස්ථාන වෙත වාර්තාවන ළමා අපයෝජන පිළිබඳ,ප්‍රථම වාර්තා, (First report) පැය 24 ක් ඇතුළත ජාතික ළමා ආරක්ෂක අධිකාරියට දන්වන අතර, එම ප්‍රථම වාර්තා "පොලිස් පැමිණිලි යාවත්කාලීන හා නියාමනය කිරීමේ පද්ධතියක් " (Police Complaint update monitoring system/ Police CUMS) හරහා නියාමනය කෙරේ.

(7) බාල අපරාධ කරුවන් සඳහා

1) ළමා හිතකාමී පොලිසිය සහ අධිකරණ ක්‍රියා පටිපාටි භාවිතා කළ යුතුය.
2) සැකකාර ළමයින් රැඳවුම් (රිමාන්ඩ්) නිවාස වල (09 ක) තබයි.
3) වයස අවුරුදු 12- 16 දක්වා බාල අපරාධ කරුවන් සහතික කළ පාසල් වලට (06) යොමු කරයි. එම ළමයින් ද ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික ODK අධීක්ෂණය 2020 සිට කරනු ලබයි.
4) වයස අවුරුදු 16-21 දක්වා සැකකාර ළමයින් බාල අපරාධකරුවන්ගේ පුහුණු පාසල් (training school) (වටරැක) හා අභ්‍යාස විද්‍යාල (correction centre) (පල්ලන්සේන හා තල්දෙන) (03) ට යොමු කරයි. එම ළමයින්ද ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික ODK අධීක්ෂණය 2020 සිට සිදු කරනු ලබයි.

(8) විකල්ප ළමා ආරක්ෂණ මධ්‍යස්ථානසම්බන්ධීකරණය හා නියාමනය
1) අවම ප්‍රමිතීන්

විකල්ප ළමා ආරක්ෂණ මධ්‍යස්ථාන 11 ක් සඳහා අවම ප්‍රමිතීන් (Minimum Standards) 11 ක් ODK ඩිජිටල් ක්‍රමයට සංවර්ධනය කර ඇත.

1. පාසල් ළමා ආරක්ෂක කමිටු අවම ප්‍රමිතීන් (Annexure 08)
2. ළමා සංවර්ධන මධ්‍යස්ථාන අවම ප්‍රමිතීන් (Annexure 09)
3. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන අවම ප්‍රමිතීන්,
4. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන අවම ප්‍රමිතීන්,
5. විශ්වාසවන්ත ඥාතීන්ගේ අවම ප්‍රමිතීන්,
6. ළමා නේවාසිකාගාර අවම ප්‍රමිතීන්
7. රජයේ රැඳවුම් (රිමාන්ඩ්) නිවාස අවම ප්‍රමිතීන්
8. බාල අපරාධකරුවන්ගේ පුහුණු පාසල් අවම ප්‍රමිතීන්
9. රජයේ සහතික කළ පාසැල් අවම ප්‍රමිතීන්
10. රජයේ භාර ගැනීමේ මධ්‍යස්ථාන අවම ප්‍රමිතීන්
11. අනිවාර්ය අධ්‍යාපනය පිළිබඳ පාසල් කමිටු අවම ප්‍රමිතීන්

2) ODK ඩිජිටල් නියාමනය
විකල්ප ළමා ආරක්ෂණ මධ්‍යස්ථාන 11 ක් සඳහා ODK ඩිජිටල් නියාමන ක්‍රම 11 ක් සංවර්ධනය කර ඇත. මේ නිසා, වාර්ෂික නියාමන 400 සිට 50,000 දක්වා 2020 දී වැඩිකර ඇත.

1. ළමා සංවර්ධන මධ්‍යස්ථාන ODK නියාමනය (Annexure 10) - 400
2. පාසල් ළමා ආරක්ෂක කමිටු ODK නියාමනය - 6,000
3. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ODK නියාමනය - 19,600
4. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ODK නියාමනය - 12,000
5. විශ්වාසවන්ත ඥාතීන්ගේ ODK නියාමනය - 300
6. අනිවාර්ය අධ්‍යාපනය පාසල් කමිටු ODK නියාමනය - 14,022
7. රජයේ රැඳවුම් (රිමාන්ඩ්) නිවාස ODK නියාමනය - 16
8. රජයේ භාර ගැනීමේ මධ්‍යස්ථාන ODK නියාමනය - 09
9. සහතික කළ පාසැල් (ගම්පහ 02, අනුරාධපුර, බදුල්ල, ගාල්ල,යාපනය) ODK නියාමනය - 06
10. බාල අපරාධකරුවන්ගේ පුහුණු පාසල හා අභ්‍යාස විද්‍යාල ODK නියාමන - 03
11. ළමා නේවාසිකාගාර ODK නියාමනය

3) ODK නියාමනයේ වැදගත්කම

මේ සඳහා 2020 ළමා සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය ඊට පෙර කළ ළමා සංවර්ධන මධ්‍යස්තාන නියාමනය සමග සැසඳිය හැක.

| ළමා සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය | 2020 ට පෙර | 2020 ජනවාරි 01 න් පසු |
|---|---|---|
| **1.** ආකෘතිය | කඩදාසි මත පදනම් වූ ක්‍රමයකි | ODK ඩිජිටල් ක්‍රමයකි |
| **2.** ප්‍රශ්නාවලිය | පුද්ගල බද්දය | අරමුණු ගතය |
| **3.** වියදම් | ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට රු. 3500/= | ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට රු. 00/= |
| **4.** අධීක්ෂණ | වාර්තා ප්‍රධාන කාර්යාලයට යොමු කිරීම තැපෑලෙන් - ඒ සඳහා දිගු කාලයක් ගතවේ | අන්තර්ජාලය හරහා - එවෙලේම ලැබේ |
| **5.** නියාමනය | අපහසුය | ඉතා පහසුය |
| **6.** විශ්ලේෂණය | අතින් දත්ත ඇතුළු කළ යුතුයි | මාර්ගගතව ඇතුළු වෙයි |
| **7.** තක්සේරුව | ඊළඟ අවුරුද්දේ | සති 2 කින් |
| **8.** රතු හෝ කහ නම් සමාලෝචනය | සමාලෝචනයක් නැත | රතුනම් - සති 2 කින්<br>කහ නම් - මාස 6 කින් |

4) 2020 ළමා නිවාස අධීක්ෂණයේ GPS ආකෘතිය - එමගින් ශ්‍රී ලංකාව තුල ළමා නිවාස (315) ව්‍යාප්ත වී ඇති ආකාරය මනාව පැහැදිලි වේ. (Annexure 11)

5) නියාමනයන් සම්බන්ධීකරණය

1. NCPA CUMS - 1929 හා අනෙක් ක්‍රම මගින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට වාර්තාවන ළමා අපයෝජන “NCPA පැමිණිලි යාවත්කාලීන හා නියාමනය කිරීමේ පද්ධතියක් ” (NCPA Complaint update monitoring system/NCPA CUMS) හරහා නියාමනය හා සම්බන්ධීකරණය කෙරේ. (Annexure 12)

2. (Police CUMS) ප්‍රාදේශීය පොලිස් ස්ථාන වෙත වාර්තාවන ළමා අපයෝජන පිළිබඳ “ප්‍රථම වාර්තා” (First report) පැය 24 ක් ඇතුළත ජාතික ළමා ආරක්ෂක අධිකාරියට දන්වන අතර, එම ප්‍රථම වාර්තා “පොලිස් පැමිණිලි යාවත්කාලීන හා නියාමනය කිරීමේ පද්ධතියක්” (Police Complaint update monitoring system/Police CUMS) හරහා නියාමනය හා සම්බන්ධීකරණය කෙරේ. (Annexure 13)

7.4. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින්ගේ වගකීම

1. අදාළ නිලධාරී රෝහලේ පැවැත්වෙන ආයතනික සිද්ධි සමාලෝචන වැඩ සටහනට සහභාගී විය යුතුය.
2. ළමයාගේ වයසඅවුරුදු 16 වනතුරු අනිවාර්ය අධ්‍යාපන සැලසිය යුතුයි, ඇතුළු අනෙකුත් ඔවුන්ගේ රාජකාරි ලයිස්තුවේ සඳහන් කරුණු සඳහා සේවා සපයයි.

7.5. පරිවාස නිලධාරියාගේ කාර්යභාරය

1. පරිවාස නිලධාරී ළමයාගේ කළමනාකරු වෙයි.
2. එම නිලධාරී ළමයා හා පවුල පිළිබඳ පරිසර වාර්තාව සකස් කළ යුතුයි
3. එම නිලධාරී රෝහලේ පැවැත්වෙන ආයතනික සිද්ධි සමාලෝචන වැඩ සටහනට සහභාගී විය යුතුය. එහිදී ලබා ගත් තීරණ පිළිබඳ වාර්තාව මහේස්ත්‍රාත් උසාවියට භාර දිය යුතුයි

4. එමෙන්ම ළමයා පිළිබඳ පසුවිපරම් කොට සෑම මාස 03 කට වරක් රෝහලේ ළමා රෝග හා මානසික රෝග වෛද්‍යවරුන් සමග සාකච්ඡා කළ යුතුයි, ඇතුළු අනෙකුත් ඔවුන්ගේ රාජකාරි ලයිස්තුවේ සඳහන් කරුණු සඳහා සේවා සපයයි.

7.6. ඔබේ වගකීම

1. වරදක් යනු ශ්‍රී ලංකාවේ බලපවත්නා යම් නීතියක් මගින් දඬුවම් පැමිණිවිය හැකි යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් අදහස් වේ. වරදක් කිරීම පිළිබඳ සෑම තොරතුරක්ම පොලිස් නිලධාරියකු වෙත හෝ පරීක්ෂකයකු වෙත වාචිකව හෝ ලියවිල්ලකින් හෝ දිය හැකිය.[21]

2. කිසියම් වරදකට නීතියකින් දඬුවම් කළ හැකි නම් එය අපරාධයක් බවට පත්වෙයි.[22]

7.7. පොලිස් නිලධාරියාගේ වගකීම

(1) පැමිණිලි

ළමා අපයෝජන සම්බන්ධ සියලු පැමිණිලි භාරගත යුතුයි. මූලික විමර්ශනයෙන් පසුව උසාවියට කරුණු වාර්තා කළ යුතුය

(2) මුල් තොරතුර
1) වරදක් පිළිබඳ තොරතුරක් පොලිස් නිලධාරියකුට වෙත වාචිකව ඉදිරිපත් කළ විට එය ඉදිරිපත් කළ භාෂාවෙන් පොලිස් නිලධාරී විසින් ලියා ගත යුතු අතර අදාළ ලේඛණයේ අඩංගු දේවල් තොරතුරු දැන්වූ තැනැත්තාට ඇසෙන සේ කියවිය යුතුයි.[23]

2) තොරතුර ලබාදෙන ලද භාෂා වෙන් එය වාර්තාගත කිරීමට පොලිස් නිලධාරියාට නොහැකි නම් එය ලිඛිතව දෙන ලෙස ඉල්ලාසිටිය යුතුයි. ලිඛිතව දීමට නොහැකි නම් ජාතික භාෂා අතුරෙන් එක භාෂාවකින් එය වාර්තා කිරීමට සිදුවූ හේතු වාර්තාගත කිරීමෙන් පසුව පොලිස් නිලධාරියා විසින් ඒ තොරතුරු එක භාෂාවකින් වාර්තා කොට, තොරතුරු දැන්වූ තැනැත්තාට ඇසෙන සේ

21 1979 අංක 15 අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 109 (1). http://www.commonlii.org/lk/legis/num_ act/ cocpa15o1979 276/

22 Prevention of crimes (Amendment) Act, No. 29 of 2017

23 Code of Criminal Procedure Act (No. 15 of 1979) section 109 (2). http://www.commonlii.org/ lk/legis/ num_ act/ cocpa15o1979276/

කියවීම හෝ භාෂා පරිවර්තනය කිරීම කළ යුතුය. (සිංහල හා දෙමළ ශ්‍රී ලංකාවේ ජාතික භාෂාය.[24]

3) පුද්ගලයකු ලියවිල්ලකින් හෝ වාචිකව දෙනු ලබන තොරතුර එම පුද්ගලයා විසින් අත්සන් කළ යුතු අතර එය අප්‍රමාදව ස්ථාන භාර නිලධාරියා සතු "තොරතුරු සටහන් පොත" (Information Book/IB) හි ඇතුළත් කළ යුතුය.[25]

4) මෙය මුල් තොරතුර වන අතර, එය 109(1) යටතේ වාර්තා කර ගැනීමෙන් පසු අපරාධ විමර්ශනයක් ආරම්භ වෙයි. මේ නිසා මෙම තොරතුරට විශාල නීතිමය වටිනාකමක් ඇත. නමුත් පැමිණිලිකරුට එහි පිටපතක් ලබා ගත නොහැක.

(3) මුලික විමර්ශනය

1) වීඩියෝ සාක්ෂි පටිගත කිරීම - ස්ථානාධිපතිවරයාට වීඩියෝ සාක්ෂි පටිගත කිරීමට දිනයක් ජාතික ළමා ආරක්ෂක අධිකාරියෙන් ඉල්ලීය හැකිය. ජාතික ළමා ආරක්ෂක අධිකාරියෙන් ඉල්ලීම් කිරීමෙන් පසු වින්දිත දරුවාගේ සිද්ධි ඉතිහාසය වීඩියෝ සාක්ෂි පටිගත කළ යුතුයි.

2) භාරකාරත්වය - ළමයාගේ භාරකාරත්වය පිළිබඳ සොයා බැලිය යුතුයි

3) අධිකරණ වෛද්‍යවරයා - ළමයාව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කළ යුතුයි. ඒ සඳහා ප්‍රදේශයේ අධිකරණ වෛද්‍යවරයාට ඉදිරිපත් කළ යුතුයි

4) බාහිර සාක්ෂි සටහන් කර ගැනීම

1. පොලිස් විමර්ශනයේදී, සිද්ධි හා අවස්ථාගත කරුණු දනිතැයි සිතියහැකි ඕනැම පුද්ගලයෙකු ගෙන් ප්‍රශ්න කළ හැකි අතර ඔහු විසින් දෙන ඕනෑම ප්‍රකාශයක් ලියාගත යුතුය. එම තැනැත්තා අපරාධ චෝදනාවකට හෝ දණ්ඩනයකට හෝ රාජ සන්තක කිරීමේ භාජනය කිරීමට නැබුරුතාවයක් ඇති ප්‍රශ්න හැර අසනු ලබන සියලූ ප්‍රශ්නවලට සත්‍ය පිලිතරු දීමට බැදී සිටිය යුතුයි.[26]

---

24 Article 19 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka. http://www.commonlii. org /lk/ legis/const/2000/index.html

25 Code Of Criminal Procedure Act (No. 15 of 1979). section 109 (3) http://www.commonlii.org/lk/ legis/num act/ cocpa15o1979276/

26 1979 අංක 15 අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 110 (1). http://www.commonlii.org/lk/legis/num_ act/ cocpa15o1979276/

2. යම් ප්‍රශ්නයක් ඇසුවහොත්, ප්‍රශ්නය හා ඊට දුන් පිළිතුර ලෙස වාර්තා ගත කළ යුතුයි. කියවීමෙන් පසු කිසියම් වෙනසක් කිරීමට ප්‍රකාශකයාට අවශ්‍යනම් එය සිදු කොට ප්‍රකාශය අවසානයේ ප්‍රකාශකයා විසින් අත්සන් කළ යුතුයි. සම්පූර්ණ ප්‍රකාශයට පහළින් පහත සඳහන් සහතිකය ලිවිය යුතුය. ඉහත නම් සඳහන් ...................................... ගේ ..........................................ප්‍රකාශය මවිසින් අවංක ලෙසත් නිවැරදි ලෙසත් වාර්තා ගත කළ බව මෙයින් ප්‍රකාශ කරමි.[27]

5) ස්ථාන පරීක්ෂාව සිදු කිරීම
6) වරදකරුවන් අත්අඩංගුවට ගැනීම
7) පරිවාස නිලධාරියාට දැන්වීම - ළමයකු පොලිස් භාරයට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමට පෙර

(4) උසාවියට වාර්තා කිරීම - B හෝ A වාර්තාව මගින් උසාවියට වාර්තා කිරීම

(5) භාරකාරත්වය - සමාජ/පරිලෝචන වාර්තාව කැඳවීම හා සුදුසු භාරකාරත්වයකට පත් කිරීම.

(6) ළමා හිතකාමී පොලිසිය

1. ළමයින් සහ ඔවුන් සමග එන භාරකරුවන් "මුදල් නොගෙවන තානාපතිවරුන් " (Unpaid embessoders) ලෙස සැලකිය යුතු අතර ඔවුන්ට ළමා හිතකාමී පරිසරයක් පොලිසිය තුළ බිහි කළ යුතුය.
2. අපයෝජනයක අවාසනාවන්ත වින්දිතයකු වුවත්, භාරය හා ආරක්ෂාව සඳහා පැමිණි ළමයකු වුවත්, නීති කඩකළ බාල අපරාධකාරයකු වුවත් සෑම ළමයකුම සැලකිය යුත්තේ ළමයකු ලෙස මිස සැකකරුවකු ලෙස නොවේ.

(7) පරිවාස නිලධාරියකුට දැන්විම - ළමයකු පොලිස්භාරයට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමට පෙර ළමා හා යෞවන ආඥා පනතේ 17 (1) වගන්තිය ප්‍රකාරව පරිවාස නිලධාරියාට දැන්විය යුතුය.

---

27 1979 අංක 15 අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 109 (2). http://www.commonlii.org/lk/legis/num_ act/ cocpa15o1979276/

(8) මුල් වාර්තාව - ළමා අපයෝජනයක් වාර්තාවී පැය 24 ක් ඇතුළත එහි "මුල් වාර්තාව (First report)" ජාතික ළමා ආරක්ෂක අධිකාරියට 0112 779196 යන අංකයට ෆැක්ස් කළ යුතුයි.

(9) අදාළ ප්‍රාදේශීය පොලිසියට යොමු කිරීම - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අපයෝජන පිළිබඳ විමර්ශන අදාළ ප්‍රාදේශීය පොලිසියට යොමු කළ වට ඊට පිළිතුරු පැය 48 ක් ඇතුළත 0112 779196 ට ෆැක්ස් කළ යුතුයි.

7.8. නීතිපති දෙපාර්තමේන්තුව - නීති නිලධාරින්ගේ වගකීම

1. ළමා අපයෝජන නඩු වලට මුල් තැන දීම හා
2. ඉක්මනින් නඩු අවසන් කිරීම, ඇතුළු අනෙකුත් ඔවුන්ගේ රාජකාරි ලයිස්තුවේ සඳහන් කරුණු සඳහා සේවා සපයයි.

7.9. අධිකරණය

1. ළමා මහේස්ත්‍රාත් අධිකරණ නමයක් (09 ක්) පළාත් නමයෙහි (09 හි) ඇති කර මෙම නඩු කඩිනමින් අවසන් කළ යුතුයි. දැනට (2020 වන විට) එවැනි අධිකරණ පවතින්නේ කොළඹ හා යාපනයේ පමණි.

2. ළමා මහා අධිකරණ නමයක් (09 ක්) පළාත් නමයෙහි (09 හි) ඇති කර මෙම නඩු ඉක්මනින් අවසන් කළ යුතුයි. දැනට (2020 වන විට) එවැනි අධිකරණයක් පවතින්නේ අනුරාධපුරයේ පමණි.

3. ළමයාට අපයෝජකයා නොපෙනී සාක්ෂි දීමට දුරස්ථ ක්‍රම ආරම්භ කළ යුතුය.

4. පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවා ළමා ආරක්ෂාව පාසල තුළ තහවුරු කළ යුතුයි.

5. කායික හෝ මානසික දඬුවම් දීම සම්පූර්ණයෙන් නැවැත්විය යුතුයි

7.10. අධ්‍යාපන අමාත්‍යංශයේ නිලධාරින්ගේ වගකීම

1. වින්දිත දරුවා එම පාසලේම තබා ගැනීමට කටයුතු කළයුතුයි.
2. අනිවාර්යය අධ්‍යාපන පාසල් කමිටු පිහිටුවා පළාතේ

7.11 මාධ්‍යවේදීන්ගේ වගකීම

1 අනන්න්‍යතාවය හඳුනාගත හැකි පරිදි ළමා අපයෝජන සහ නොසැලකිලිමත්කම පිළිබඳ සිදුවීම් මාධ්‍යයෙන් ප්‍රචාරණය සම්පුර්ණයෙන් වැළැක්විය යුතුය. එය දණ්ඩ නීති සංග්‍රහයේ 365C වගන්තිය යටතේ අවුරුදු 2 ක් දක්වා සිරගත කළ හැකි වරදකි.

# (08) ළමා හිංසනයට අදාළ නීති

**දණ්ඩ නීති සංග්‍රහයේ අඩංගු නීති ප්‍රතිපාදන**

**8.1. වගන්ති 75 හා 76**

**වයස අවුරුදු 12 ට අඩු ළමයකුගේ ක්‍රියාව - වයස අවුරුදු 12 ට අඩු ළමයෙකු නීතිය ඉදිරියේ අපරාධකරුවකු ලෙස නොසැලකේ.[28] ප්‍රමාණවත් ලෙස පැසුණු බුද්ධියක් නොමැති වයස අවුරුදු 12 - 14 දක්වාවූ ළමයෙකුගේ ක්‍රියාවද - සාපරාධී වගකීම් වලින් බැහැර වේ.[29]**

**8.2. වගන්ති 286A (ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය පළ කිරීම්, ප්‍රදර්ශනය ආදිය)**

**ළමයින්ගේ අශ්ලීල හෝ අසභ්‍ය ප්‍රකාශනය සඳහා වසර 2 කට නොඅඩු හා වසර 10 කට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමෙන් ද දඩයෙන් ද දඬුවම් කළ හැකිය.[30]**

**8.3. වගන්ති 288 (ළමයින්ට සිඟාකෑමට සැලැස්වීම හෝ කුට්ටනය කිරීම)**

**ළමයකු හිඟමනෙහි යොදවා ගැනීම වසර 05 කට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමෙන් ද දඩයෙන් ද දඬුවම් කළ හැකිය.[31]**

**8.4. වගන්ති 288A (ලිංගික සංසර්ගය සඳහා කුට්ටනියකු වශයෙන් ක්‍රියාකිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම)**

**මේ සඳහා වසර 02 කට නොඅඩු හා වසර 05 කට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමෙන් ද දඩයෙන් ද දඬුවම් කළ හැකිය.[32]**

---

28 Act of a child under twelve years of age (Sec 75), Amendment Act, No. 10 of 2018, Sec 75 of penal code

29 Act of a child above twelve and under fourteen years of age, who has not sufficient maturity of understanding (Sec 76), Amendment Act, No. 10 of 2018, Sec 76 of penal code.

30 Obscene publication exhibition relating to children. [2,22 of 1995],Sec 286A of the penal code. https://www.refworld.org/pdfid/4c03e2af2.pdf

31 Causing or procuring children to beg. [3, 29 of 1998], Sec 288 of the penal code. https:// www. refworld.org/ pdfid/4c03e2af2.pdf

32 Hiring or employing children to act as procurers. [3,29 of 1998], Sec 288A of penal code. https://www.refworld.org /pdfid/4c03e2af2.pdf

8.5. වගන්ති 288B (සීමිත භාණ්ඩ [මත්ද්‍රව්‍ය] ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයෙහි යෙදවීම)

ළමයකු යොදා මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම සඳහා වසර 05 කට නොඅඩු හා වසර 07 කට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමෙන් ද දඩයෙන් ද දඬුවම් කළ හැකිය.[33]

8.6. වගන්ති 308A (ළමයින් කායික හෝ මානසික කෲරත්වයට භාජනය කිරීම)

කායික හෝ මානසික කෲරත්වය වසර 02 කට නොඅඩු හා වසර 10 කට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමෙන් ද දඩයෙන් ද දඬුවම් කළ හැකිය.[34]

8.7. වගන්ති 352 (නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කිරීම)

වසර 14 ට අඩු පිරිමි දරුවකු හෝ වසර 16 ට අඩු ගැහැණු දරුවකු පැහැර ගැනීම නීති විරෝධීය. වසර 07 කට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමෙන් ද දඩයෙන් ද දඬුවම් කළ හැකිය.[35]

8.8. වගන්ති 358 (යුද්ධයේ යෙදවීම සඳහා ළමයින් බඳවා ගැනීම)

ළමයාගේ ජීවිතයට අන්තරායක් ඇති හෝ ඒ ළමයාට ශාරීරික වශයෙන් හෝ ඔහුගේ හැඟීම්වලට හානි සිදු වීමට ඉඩ ඇති පරිදි ළමයකු සන්නද්ධ ගැටුමකට සම්බන්ධ කර ගැනීම සඳහා වසර 30 කට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමෙන් ද දඩයෙන් ද දඬුවම් කළ හැකිය.[36]

8.9. වගන්ති 360A කුට්ටනය (කවරකු හෝ ගණිකා වෘත්තියේ යෙදවීම)

මේ සඳහා වසර 02 කට නොඅඩු හා වසර 10 කට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමෙන් ද දඩයෙන් ද දඬුවම් කළ හැකිය.[37]

8.10. වගන්ති 360B (ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම)

---

[33] Hiring or employing children to traffic in restricted articles. [ 3,29 of 1998], Sec 288B of penal code

[34] Cruelty to children. [ 3, 22 of 1995] and [ 4, 16 of 2006], Sec 308A of penal code

[35] Punishment for kidnapping. Sec 354 of penal code.

[36] Debt bondage, serfdom, forced or compulsory labour, slavery and recruitment of children for use in armed conflict. [7,16 of 2006], Sec 358A of penal code

[37] Procreation. [7,22 of 1995], [ 5,29 of 1998], Sec. 360A of penal code. https://www.refworld.org/pdfid/4c03e2af2.pdf

ළමයින්ගේ අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම සඳහා වසර 05 කට නොඅඩු හා වසර 20 කට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමෙන් ද දඩයෙන් ද දඬුවම් කළ හැකිය.[38]

8.11. වගන්ති 360C (තැනැත්තන් වෙළදාම් කිරීම)

තැනැත්තන් වෙළදාම් කිරීම සඳහා වසර 03 කට නොඅඩු හා වසර 20 කට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමෙන් ද දඩයෙන් ද දඬුවම් කළ හැකිය.[39]

8.12. වගන්ති 360D (දරු කමට හදා වඩා ගැනීම සම්බන්ධ වැරදි)

නීති විරෝධී කුලවද්දා ගැනීම සඳහා වසර 20 කට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමෙන් ද දඩයෙන් ද දඬුවම් කළ හැකිය.[40]

8.13. වගන්ති 360E (ළමයකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීම

ළමයකු හෝ ළමයකු යැයි සිතා ලිංගික සංසර්ගය සඳහා ඇවිටිලි කිරීම සඳහා වසර 10 කට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමෙන් ද දඩයෙන් ද දඬුවම් කළ හැකිය.[41]

8.14. වගන්ති 363 (ස්ත්‍රී දූෂණය)

ලිංගික සංසර්ගයක් සඳහා කැමැත්ත දීමට හැකි අවම වයස වන්නේ යමෙකුගේ වයස අවුරුදු 16 සම්පූර්ණ වූ විටය. වයස අවුරුදු 16ට අඩු ගැහැණු ළමයකු සමග ලිංගික සංසර්ගයක් සිදු කිරීම ස්ත්‍රී දූෂණය යටතට ගැනේ. ස්ත්‍රී දූෂණය සඳහා වසර 07 කට නොඅඩු හා වසර 20 කට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමෙන් ද දඩයෙන් ද දඬුවම් කළ හැකිය.[42]

8.15. වගන්ති 364A (ව්‍යභිචාරය)

---

38 Sexual exploitation of children[8,22 of 1995],Sec 360B of penal code. https://www.refworld.org/ pdfid/4c03e2af2.pdf

39 Trafficking.[ 8, 22 of 1995], [ 8, 16 of 2006], Sec 360C of penal code.https://www.refworld.org/pdfid /4c03e2af2.pdf

40 Offences related to adoption. [ 9, 16 of 2006], Sec 360D of penal code. https://www.refworld.org / pdfid/4c03e2af2.pdf

41 Soliciting a child.[ 9, 16 of 2006], Sec 360E of penal code

42 'Rape'. (2, 22 of 1995),Sec. 363 of the penal code https://www.refworld.org/pdfid/4c03e2af2.pdf

අවුරුදු 16 ට අඩු ගැහැණු ළමයකු නීතියේ හඳුනා ගත් නෑදෑයකු විසින් දූෂණය කිරීම සඳහා වසර 07 කට නොඅඩු හා වසර 20 කට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමෙන් ද දඩයෙන් ද දඬුවම් කළ හැකිය.[43]

8.16. වගන්ති 365 (අස්වාභාවික වැරදි)

පුද්ගලයෙකු/සතෙකු සමග මුඛය/ගුද සංසර්ගය වැනි අස්වාභාවික වැරදි සඳහා වසර 10 කට නොඅඩු හා වසර 20 කට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමෙන් ද දඩයෙන් ද දඬුවම් කළ හැකිය.[44]

8.17. වගන්ති 365A (තැනැත්තන් අතර දැඩි අශික්ෂිත ක්‍රියා)

මේ සඳහා වසර 10 කට නොඅඩු හා වසර 20 කට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමෙන් ද දඩයෙන් ද දඬුවම් කළ හැකිය.[45]

8.18. වගන්ති 365B (බරපතල ලිංගික අපයෝජනය)

ශිෂ්ණය, ඇඟිලි හෝ වස්තුවක් විවරයක හෝ ශරීරයේ ඕනෑම කොටසක් මත භාවිතය සඳහා වසර 07 කට නොඅඩු හා වසර 20 කට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමෙන් ද දඩයෙන් ද දඬුවම් කළ හැකිය.[46]

ළමයින්ට අදාළ අනෙකුත් විශේෂ නීති

8.19. නඩත්තු පනත (1999 අංක 32)

ළමයකුට නඩත්තු ලබා ගතහැකි උපරිම වයස - ළමයකුට නඩත්තු ලබා ගතහැකි උපරිම වයස අවුරුදු 18කි. එහෙත්, අධ්‍යාපනය ලබනවානම් අවුරුදු 25 දක්වාත්, ආබාධිත නම් මිය යනතුරුත් නඩත්තු ලබා ගත හැකිය.[47]

---

43 Incest. [15,22 of 1995], Sec 364A of penal code. https://www.refworld.org/pdfid/4c03e2af2.pdf

44 Unnatural offence. [ 17,22 of 1995] and [ 11,16 of 2006], Sec 365 of penal code. https://www.refworld.org /pdfid/4c03e2af2.pdf

45 Acts of gross indecency between persons. [18,22 of 1995] and [ 12, 16 of 2006], Sec 365A of penal code. https://www.refworld.org/pdfid/4c03e2af2.pdf

46 Grave sexual abuse [19,22 of 1995] and [13,16 of 2006], Sec 365B of penal code. https://www.refworld.org /pdfid/4c03e2af2.pdf

**8.20. සාමාන්‍ය විවාහ පනත (No 22 of 1995)**

**විවාහ වීමේ වයස - විවාහ වීමටනම් වයස අවුරුදු 18 සම්පූර්ණ විය යුතුය.**[48]

**8.21. ස්ත්‍රීන්, තරුණයින් සහ ළමයින් සේවයේ නියුක්ත කිරීමේ පනත (No 47 of 1956)**

**මෙහි කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීම.**[49]

**8.22. ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥාපනත (No 48 of 1939)**

**මෙහි කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීම.**[50]

**8.23. අධ්‍යාපන ආඥාපනත යටතේ (No 31 of 1939)[51] සාදන ලද අනිවාර්ය අධ්‍යාපනයට අදාළ නියෝග**

**මෙහි කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීම.**[52]

**8.24. 2005 අංක 34 දරන ගෘහස්ත ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත**

**එම පනතේ 2 (2) (ආ) (iii ) යටතේ පීඩාවට පත් ළමයකු වෙනුවෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ලිඛිතව බලය පැවරූ නිලධාරියකුට (Authorized Officer) අදාල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ආරක්ෂක ආඥාවක් (Protection order) නිකුත් කරව ගැනීම සඳහා ඉල්ලීමක් සිදු කල හැක.**[53]

**පොලිස් නිලධාරියාටද මෙම බලය ඇත.**

---

47 Maintenance Act No. 32 1999. https://www.srilankalaw.lk/ YearWisePdf/1999/ MAINTENANCE_ ACT_No_37 OF 1999 .pdf

48 Act No. 22 of 1955- Marriages (General)-an ordinance to consolidate and amend the law relating to marriages other than the marriages of Muslims and to provide for the better registration. http://citizenslanka.org/wp-content/uploads/ 2016/02/Marriage-Registration-Ordinance-No-19-of-1907-E.pdf

49 Employment of Women, Young Persons, and Children. Acts No. 47 of 1956 and No 43 of 1964. https:// www. ilo.org/dyn /travail/docs/1658/%20EMPLOYMENT%20%20OF%20WOME

50 Children and young persons Ordinance. No 48 of 1939. http://socialproba.cp.gov.lk/ download/ord_ 1939_ 48_ en.pdf

51 Education Ordinance (No. 31 of 1939). http://socialproba.cp.gov.lk/ https://www.lawnet.gov.lk / education-2

52 Extraordinary Gazette notification on The Compulsory Attendance of Children at Schools Regulations. 2016. http://www.documents.gov.lk/en/exgazette.php

53 2005 No. 34 Prevention of Deomestice Violence Act. https://www.srilankalaw.lk/Volume-VI/prevention-of-domestic-violence-act.html

# (9) ළමා අපයෝජන වැළැක්වීමට ගතහැකි පියවර

9.1. පියවර

1. දෙමාපියන් හා දරුවන් අතර බැඳීම තව තවත් ශක්තිමත් කිරීම.
2. දරුවන් සමග ගත කරන ගුණාත්මක කාලය වැඩි කිරීම.
3. දරුවන් සමග මිතුරෙකු සේ සමීප සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම.
4. ළමා අපයෝජකයන්ගේ හැසිරීම් පිළිබඳව කල් තියා දරුවා දැනුවත් කිරීම.
5. දරුවා සමග සබඳතා පවත්වන පුද්ගලයන් පිළිබඳ විමසිලිමත් වීම.
6. දරුවන් දෙමාපියන් හැර බාහිර භාරකරුවන් වෙත යොමු නොකිරීම.
7. පාසල් ළමුන් හා ගුරුවරුන් දැනුවත් කිරීම යනාදිය වේ.

9.2. දරුවාගේ සිතෙහි ඇති වන කම්පනය සුව කිරීමට ඔබට ගතහැකි පියවර

1. දරුවන් විවිධ අපයෝජනවලට ගොදුරුවීම නිසා දරුවන්ගේ සිතේ කම්පන තත්ත්වයක් ඇති වේ. මෙහිදී සිතෙහි ඇතිවන කම්පනය ලෙස හඳුන්වන්නේ දරුවන්ගේ ශාරීරික හෝ මානසික පීඩනයන්ට හේතු වන දැඩි තත්ත්වයකි.

2. සිතෙහි ඇතිවන කම්පනය නිසා දරුවන්ට හිංසනය සිදුවිය හැකිය. මෙම තත්ත්වය දරුවන්ගේ මනස වර්ධනය වන අවධිය දක්වාම විවිධ අයුරින් බලපෑම් ඇති කරයි. එම බලපෑම් පාසලට, පවුලේ සබඳතාවලට අහිතකර ලෙස බලපානවා පමණක් නොව මත්වතුර හා මත් කුඩුවලට දරුවා යොමු කිරීමට ද වක්‍ර ලෙස දායක වෙයි.

3. 1929 හරහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියට දන්වා, ''සිත් සවිය'' ළමා කේන්ද්‍රීය මනෝ - සමාජීය සහාය සේවය ලබා ගත හැකියි.

9.3 සිතෙහි ඇතිවන කම්පනයෙන් ඔවුන්ව වළක්වා ගැනීමට ඔබට අනුගමනය කළ හැකි පියවර

1. ඉහත තත්ත්වය ඉවසීමෙන් හා ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම තුළින් සුව කළ හැකිය. ඒ සඳහා ඔබේ දරුවාට ඔබේ ආරක්ෂාව පවතින බව දැනෙන්නට හැරිය යුතුය. තවද, ආහාර ගැනීමට, සෙල්ලම් කිරීමට හා නිදා ගැනීමට නිශ්චිත කාල සටහනක් පවත්වා ගෙන යා යුතුය. එසේම ඕනෑම වෙනස්වීමක හා නව අත්දැකීම්වලට දරුවා සූදානම් කිරීම ඔබ කළ යුතුය.

2. දරුවන්ට ඔවුන්ගේ හැඟීම් පිළිබඳ දෙමාපියන් සමග කතා කිරීම තුළින් ඔවුන් හුදකලා නොමැති බවත්, ඔබ හැමවිටම දරුවාගේ මිතුරෙකු ලෙස හා ආරක්ෂකයෙකු ලෙස සිටින බවට දරුවාට හැඟීමට සැලැස්වීම කළ යුතුය. නමුත් මෙහිදී තමන් සමග කතා කරන ලෙස බල කිරීම නොකළ යුතුය. ඉහත තත්ත්වය අපයෝජනයට ගොදුරු වූ පසු ඇතිවන සාමාන්‍ය තත්ත්වයන් බව දරුවන්ව දැනුවත් කිරීමත්, ඔවුන්ගේ කතාවලට සවන් දීමට ඔබ කාරුණික වීමත් කළ යුතුය. තවද, ඔවුන්ගේ ප්‍රතිචාරයන් පිළිබඳ ඔබගේ අවධානය යොමු කළ යුතු අතර, ඔවුන් සිදු කරන අප්‍රසන්න ක්‍රියාවන් නිවැරදි කිරීමට සහ එය ඔවුන්ගේ වරදකින් සිදු නොවූ බව පහදා දීම කළ යුතුය.

